# තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොතානේගම ව්‍යාපෘති ප්‍රදේශය සඳහා වූ ඇගයීම් වාර්තාව


අයි. ආර්. පෙරේරා

එන්.එස්.බී. ඇපාකන්ද

ඩී. ඒ. කරුණාරත්න



හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

114 විජේරාම මාවත

කොළඹ 07

2003 දෙසැම්බර්





711.3
(SL)
හෙක්ට

2009/06 2010/04

200/-

# තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොතානේගම ව්‍යාපෘති ප්‍රදේශය සඳහා වූ ඇගයීම් වාර්තාව

අයි. ආර්. පෙරේරා

එන්.එස්.බී. ඇපාකන්ද

ඩී. ජ. කරුණාරත්න

MFN 5868

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

114 විජේරාම මාවත

කොළඹ 07

2003 දෙසැම්බර්



21456

21456

පුස්තකාලය
LIBRARY
HARTI

## පළමුවන පරිච්ඡේදය

## තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන පිළිබඳ හැඳින්වීම.

### 1.1 පිවිසුම

ආර්ථික හා සමාජීය වශයෙන් වඩා වැදගත් වූ මෙරට පාරිභෝගික කෘෂිකාර්මික ක්ෂේත්‍රය මෑතක සිට වඩාත් පසුගාමී හා අකාර්යක්ෂම එකක් බවට පත්ව ඇත. රටෙහි ජනගහණයෙන් 75% ක් පමණ ග්‍රාමීය අංශයෙහි ජීවත් වන අතර ශ්‍රම බලකායෙන් 35% ක් පමණ කෙළින් ම හෝ වක්‍ර අන්දමින් කෘෂිකර්මය හා සම්බන්ධ කටයුතුවල නියුතුව ජීවිකාව කරගෙන යති. මුළු ජනගහණයෙන් 70% ක් පමණ කෘෂිකර්මය මත යැපෙති. මෙතරම් වැදගත්කමක් දරනු ලබන දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ මෑත භාගයේ දැකගත හැකි ප්‍රවණතා වන්නේ අඩු නිෂ්පාදන ඵලදායීතාවය, අඩු ආදායම්, වැඩි නිෂ්පාදන පිරිවැය, නිෂ්පාදන සඳහා ප්‍රමාණවත් මිලක් නො ලැබීම හා එය උච්චාවචනයට භාජනය වීම, රැකියා හිඟයක් පැවතිය දී වුව ද ජනතාව කෘෂිකර්මයෙන් තව තවත් බැහැර වීම යනාදිය යි. මේ තත්ත්වය ග්‍රාමීය ප්‍රදේශවල සමාජ ආර්ථික තත්ත්වය පහළ බැසීමටත්, දුප්පත්කම වර්ධනය වීමටත් හේතු වී ඇත.

නිදහස් ආර්ථික ප්‍රතිපත්තීන් යටතේ වර්තමාන ග්‍රාමීය ක්ෂේත්‍රය මුහුණ පා ඇති ඉහත දැක්වූ අභියෝග ජය ගැන්ම තුළින් සමෘද්ධිමත් ගොවි ජන සමාජයක් බිහි කිරීම සඳහා යොමු වූ නව ව්‍යාපෘතියක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් ආරම්භ කරනු ලැබ ඇති අතර එය "තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන" වේ. මෙම වැඩසටහන කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍ය ගරු එස්.බී. දිසානායක ඇමතිතුමාගේ අදහසක් හා දිරිගැන්වීම මත ඇරඹීම සුවිශේෂ වූ කරුණකි.

### 1.2 තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන.

ඉහත දැක් වූ පරිදි විවිධාකාර වූ ප්‍රශ්න ග්‍රාමීය ක්ෂේත්‍රය තුළ පැවතිය ද ඒවා බොහොමයක් විසඳීම සඳහා අවශ්‍ය සම්පත් හා හැකියාවන් එම ක්ෂේත්‍රය තුළම පවතී. එවැනි දෑ හඳුනා ගැනීමත්, ඒවා විධිමත් පරිදි උපයෝගී කර ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික, කළමනාකරණ හා සංවිධානාත්මක විධි හා ක්‍රමෝපායයන් පිළිබඳව අත්හදා බැලීමක් සඳහා ආරම්භ කරනු ලැබූ පර්යේෂණ ව්‍යාපෘතිය "තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන" වෙයි.

මෙම වැඩසටහන යටතේ දිවයිනේ විවිධ කෘෂි දේශගුණික කලාපයන්ගෙන් "ක්ෂේත්‍ර පර්යේෂණාගාර" ලෙස තෝරාගනු ලැබූ ගම් "ආදර්ශන" ගෙවත් "ආදර්ශ ගම්මාන" ලෙස දියුණු කිරීමට උත්සාහ ගනු ලැබිනි. එසේ කරනු ලැබුයේ එම ගම්වල කරනු ලැබූ විවිධ



පුස්තකාලය
LIBRARY

අත්හදා බැලීම් එම ගම් තුළම භාවිතයට සැලැස්වීමෙන් වූ අතර එවැනි ආදර්ශ ගම්මාන බිහි කිරීමේ අරමුණ වූයේ අසල්වැසි අනෙකුත් ගම්වලටත් එවැනි සාර්ථක අත්දැකීම් අනුගමනය කිරීම තුළින් දියුණුව සලසා ගැනීමට අවස්ථාව ලබා දීම ය.

මෙම වැඩසටහනෙහි මූලික ලක්ෂණය වන්නේ ඒකාබද්ධ සංවර්ධනය, සහභාගිත්ව ප්‍රවේශය හා තිරසර භාවයයි. ග්‍රාමීය සංවර්ධනයේ දී බෝග හා නිෂ්පාදනවල විවිධාංගීකරණය, ආර්ථික කටයුතුවලට අමතරව අධ්‍යාපනය, සෞඛ්‍යය, යටිතල පහසුකම් ආදී වූ සමාජ හා අනෙකුත් අංශයන්හි සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම, සංවර්ධනය සඳහා දායක කරගත හැකි සියළුම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලත්, ජනතාවගේත් සහභාගිත්වය හා සහයෝගය ඒ සඳහා උපරිම අන්දමින් ලබා ගැනීම හා පාරිසරික සමතුලිතතාවය මෙන්ම ආරම්භ කරනු ලබන ආර්ථික කටයුතු හා සංවිධානාත්මක ක්‍රමෝපායයන් ඇතුළත් සංවර්ධනාත්මක ක්‍රියාවලියෙහි දිගුකාලීන පැවැත්ම කෙරෙහි වැඩසටහන යටතේ විශේෂ අවධානය යොමු කිරීමට අපේක්ෂා කෙරිනි.

## 1.2 ව්‍යාපෘතියේ අරමුණු

මෙම ව්‍යාපෘතිය ප්‍රධාන අංග දෙකකින් සමන්විත වන අතර ඉන් ප්‍රධාන අංගය වන්නේ ඉහත දැක්වූ ආකාරයට ග්‍රාමීය සංවර්ධනය සඳහා කෙළින් ම හා ප්‍රායෝගිකව මැදිහත් වීම ය. ඒ යටතේ අනෙකුත් ගැමියන් පෙළඹවීම සඳහා විවිධ අත්හදා බැලීම් සිදු කරමින් ආදර්ශ ගම් බිහි කරනු ලැබේ. එහි දෙවන අංගය වන්නේ තොරතුරු සැපයීම තුළින් වක්‍ර අයුරින් ග්‍රාමීය සංවර්ධනය සඳහා දායක වීම ය. ඒ යටතේ කෘෂිකර්ම හා ග්‍රාමීය සංවර්ධනය සඳහා රජය අනුගමනය කරන්නා වූ ප්‍රතිපත්ති හා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් කෙරෙහි ග්‍රාමීය ජනතාවගේ ආකල්ප හා ප්‍රතිචාරයන් සම්බන්ධ තොරතුරු එක්රැස් කර ඒ පිළිබඳව තීරණ ගන්නන් හා ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කිරීමට අපේක්ෂා කෙරනි.

ආදර්ශ ගම්මාන බිහි කිරීම තුළින් ග්‍රාමීය සංවර්ධනය සඳහා ප්‍රායෝගික ලෙස යොමු වූ මෙම වැඩසටහනෙහි මූලික අංගය දෙස බලන විට එහි දිගුකාලීන මෙන්ම කෙටිකාලීන අපේක්ෂාවන් ද ගැබ්ව පවතී. ඒවා නම්:

### 1.3.1 දිගු කාලීන බලාපොරොත්තු (අභිමතාර්ථ)

I. තිරසාර වූ නිෂ්පාදන ක්‍රියාවලියක් පදනම් කරගත් ආදර්ශ ගම්මාන බිහි කිරීම.
II. ජනතාවගේ ජීවන තත්ත්වය නැංවීම.

### 1.3.2 කෙටි කාලීන බලාපොරොත්තු (අරමුණු)

I. ජනතාවගේ ආදායම් වර්ධනය කිරීම.

II. රැකියා වර්ධනය කිරීම.

III. නිෂ්පාදන ඵලදායිතාවය වර්ධනය කිරීම.

IV. ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම.

V. සංවර්ධනය සඳහා ජනතා සහභාගිත්වය උපරිම අයුරින් යොදා ගැනීම.

## 1.4 උපාය මාර්ග

ඉහත දැක්වූ අභිමතාර්ථ හා අරමුණු සඵල කර ගැනීම සඳහා විවිධ වූ ක්‍රමෝපායයන් අනුගමනය කිරීමට බලාපොරොත්තු වූ අතර ඒවා පහත සඳහන් වේ.

I. නිෂ්පාදන පිරිවැය අඩු කිරීම.

ගොවිපල නිෂ්පාදනයන්හි ආර්ථික ඵලදායී බව හා පවුලේ ආදායම් වර්ධනය සමග කෙලින්ම සම්බන්ධ වන මේ යටතේ ගොම, පිදුරු හා කොම්පෝස්ට් වැනි කාබනික ද්‍රව්‍ය භාවිතයට උනන්දු කරවීම මගින් රසායනික පොහොර භාවිතය අවම කිරීම හා එකවර වගා කිරීමට සැලැස්වීමෙන් ඒකාබද්ධ පලිබෝධ පාලනයට මග සලස්වා රසායනික ද්‍රව්‍ය භාවිතය සඳහා යන වියදම අවම කරවීම, අවශ්‍ය බීජ තම ගොවිපල හෝ ගම තුලින් ම නිපදවා ගැනීමට සලස්වා ඒ සඳහා යන අධික වියදම අඩු කිරීම යනාදිය ගැනේ.

II. නිෂ්පාදන සඳහා වඩා ඉහළ මිලක් ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම.

වෙළඳපොලෙහි වැඩි ඉල්ලුමක් ඇති බෝග හා කාබනික නිෂ්පාදනවලට උනන්දු කරවීම, වගා කාලසටහන වෙනස් කරවීම මගින් වැඩි මිලක් ලබාගත හැකි අවස්ථා වලදී නිෂ්පාදන වෙළඳපොළට දැමීමට කටයුතු සැලැස්වීම, වැඩි මිලක් ලැබෙන තෙක් අස්වනු ගබඩා කිරීම සඳහා උනන්දු කරවීම, ගොවීන් සංවිධානය කරවීම මගින් ඔවුන්ගේ කේවල් කිරීමේ ශක්තිය වර්ධනය කරවීම හා ඉදිරි වෙළඳ ගිවිසුම් අත්සන් කරවීමට සැලැස්වීම මගින් වඩාත් හොඳ මිලක් ලබා ගැනීම තහවුරු කරවීම යනාදී කාර්යයන් මෙයට ඇතුළත් ය.

III. නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම.

නිෂ්පාදන ඵලදායිතාවය වැඩි කිරීම සඳහා ඉවහල් වන නව බීජ, යෙදවුම් හා භාවිතයන් මෙන්ම නව යන්ත්‍ර සූත්‍ර හඳුන්වා දීම සහ උචිත භාවය අනුව ඒවා යොදා ගැනීමට ගොවීන් උනන්දු කරවීම මේ යටතට ඇතුළත් ය.

IV. සම්පත් කාර්යක්ෂමවී හා ඵලදායී භාවිතය

ගොවිපල මට්ටමේ ඵලදායීතාව හා ආදායම නැංවීමට හේතු කරවන බෝග විවිධාංගීකරණය මෙන්ම යටි වගාව, මිශ්‍ර වගාව යනාදිය සඳහා ගොවීන් උනන්දු කරවීම, බෝග වගාව හා සත්ව පාලනය ඒකාබද්ධ කිරීමට මග සැලැස්වීම හා දැනට භාවිතයට නොගත් ඉඩම්, ජලය ඇතුළු ස්වභාවික සම්පත් ප්‍රයෝජනයට යොදා ගැනීමට සැලැස්වීම මේ යටතේ ගැනේ.

V. නිෂ්පාදන තීව්‍රතාවය වැඩි කිරීම

ජල කළමනාකරණය කෙරෙහි ගොවීන් උනන්දු කරවීම හා විසිදුම් හා බිංදු ජල සම්පාදනය වැනි සූක්ෂම ජල සම්පාදන ක්‍රම හඳුන්වා දීම මගින් ජලය ඉතිරි කර ගැනීමට සලස්වා අමතර කන්නයක් වගා කිරීමට මග පෙන්වා දීම මේ යටතට ගැනෙන අතර කාර්යක්ෂම ලෙස සම්පත් භාවිතයට මෙන්ම ආදායම් වර්ධනයටත් මේවා හේතු වේ.

VI. කෘෂි කර්මාන්ත මෙන්ම වෙනත් කර්මාන්ත හා ස්වයං රැකියා බිහි කිරීම.

සංවර්ධනයේ විවිධාංගීකරණයට මෙන්ම ගොවි පවුල්වල රැකියා හා ආදායම් වර්ධනයට ඉවහල් වන මේ සඳහා කෘෂි සම්පත් මෙන්ම වෙනත් වටපිටාවේ ඇති සම්පත් භාවිතයෙන් ඇරඹිය හැකි කර්මාන්ත හා වෙනත් ආදායම් මාර්ග ඇරඹීමට කැමති අයට අදාල පුහුණු අවස්ථා ලබාදීම හා අවශ්‍ය පහසුකම්, උපදෙස්, අලෙවි මාර්ග යනාදිය ලබා ගැනීමට අදාල ආයතන සමග සාකච්ඡා කර මග සැලැස්වීම ඇතුලත් ය.

VII. අරපරෙස්සම්, ඉතුරුම් වර්ධනය හා ආයෝජනය සඳහා ජනතාව පෙළඹවීම.

ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීම තුලින් බීමත්කම ආදී අනවශ්‍ය වියදම් අඩු කිරීමත් සමෘද්ධි, ගොවිජන බැංකු, ග්‍රාමීය බැංකු ආදී බැංකු සමග වැඩි සබඳතාවක් ගොඩ නංවාලීම තුලින් ඉතිරි කිරීම් සඳහා මෙන්ම ආපසු ගෙවීම සඳහා ඔවුන් තුළ නැඹුරුවක් ඇති කිරීමත් එමගින් පහසුවෙන් ණය ලබා ගත හැකි අය බවටත්, අනාගත ආයෝජකයින් බවටත් පත් වීමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම.

VIII. පුනරුත්ථාපන හා ඉදිකිරීම් කටයුතු සිදු කිරීම

ආර්ථික හා සමාජ සංවර්ධනය ඇති කිරීමට හේතු වන්නා වූ කැඩී බිඳී ගිය හා ගොඩ වූ වැව්, අමුණු හා ඇලවේලි පුනරුත්ථාපනය, මාර්ග අළුත්වැඩියා කිරීම යනාදියත් කෘෂි ළිං ඇල මාර්ග, පාලම්. බෝක්කු හා ගොඩනැගිලි යනාදිය අළුතෙන් ඉදි කිරීමත් මේ යටතට ගැනේ.

IX. පාරිසරික සමතුලිතතාවය ආරක්ෂා කිරීම.

කෘෂි ඉඩම්වල පස සංරක්ෂණ සඳහා කානු, වැටි ආදිය දැමීමට සැලැස්වීම, බැමි හා ජලාශයන්ට අදාළ ජලධාර ප්‍රදේශ හා රක්ෂිතයන් හි වන වගා සඳහා උනන්දු කරවීම, පාරවල් දෙපස හා පොදු ඉඩම් යනාදියේ වන වගා කරවීම හා පෞද්ගලික ඉඩම්වල කෘෂි වන වගාවන් සඳහා උනන්දු කරවීම, ඊට අවශ්‍ය පහසුකම් සැලැස්වීම යනාදිය මේ යටතේ සිදු කෙරෙන අතර පස මෙන්ම ජල සංරක්ෂණය කෙරෙහිත් කෘෂි නිෂ්පාදනයන්හි තිරසාරත්වය කෙරෙහිත් මේවා බලපානු ලැබේ.

X. සහභාගිත්ව විධි ක්‍රම අනුගමනය හා ග්‍රාමීය සංවිධාන බිහි කිරීම.

සම්පත් හා ගැටළු හඳුනා ගැනීමේ සිට ඒවාට විසඳුම් ලබා ගැනීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරවීම, ප්‍රගති සමාලෝචනය, පසු විපරම ආදී වූ සංවර්ධනයේ හැම අවස්ථාවකදී ම ග්‍රාමීය ජනතාවගේ උපරිම දායකත්වය ලබා ගැනීම සඳහා අවශ්‍ය සංවිධාන ව්‍යුහයන් ගම තුළ බිහි කිරීම, සංවර්ධන කටයුතු හා සම්බන්ධ තීරණ ගැනීමේ දී ජනතාව සම්බන්ධ කර ගැනීම හා ඔවුන්ගේ ගැටළු යනාදිය හඳුනා ගැනීම සඳහා සහභාගිත්ව ගැමි විමසුම් ක්‍රමය වැනි සහභාගිත්ව විධි ක්‍රමයන් අනුගමනය කිරීම.

XI. ප්‍රදේශයේ රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතන ගම වෙත වඩාත් සමීප කරවීම.

කෘෂි උපදෙස් ඇතුළු සෙසු තාක්ෂණ හා විවිධ සේවාවන් සපයනු ලබන ග්‍රාමීය ආයතන ගමත් සමග වඩාත් සමීප කරවීම හා ඒ සඳහා ගම තුළ පිහිටුවන ආයතනික රාමුව උපයෝගී කර ගැනීමට කටයුතු කිරීම.

XII. නව අත්හදා බැලීම සිදු කිරීම

වෙනත් ප්‍රදේශවලින් දැක ගත හැකි සාර්ථක සංවර්ධන අත්දැකීම් පදනම් කර ගනිමින් විවිධ නිෂ්පාදන, යෙදවුම්, තාක්ෂණික භාවිතයන් සංවිධානාත්මක හා කළමනාකරණ විධි ක්‍රමයන් පිළිබඳ අත්හදා බැලීම් සිදු කිරීම.

## 1.5 ක්‍රියා මාර්ග

ඉහත සඳහන් කරනු ලැබූ විවිධ සංවර්ධන ක්‍රමෝපායන් යටතේ ගනු ලබන ක්‍රියා මාර්ග අදාළ ව්‍යාපෘති ප්‍රදේශයන්හි පවත්නා ප්‍රශ්නවල ස්වභාවය හා සම්පත් යනාදිය අනුවත් ඒවායෙහි ඇති උචිත භාවය මෙන්ම ඒ සඳහා ජනතාව දක්වනු ලබන උවමනාව හා ප්‍රමුඛත්වය මතත් තීරණය කෙරේ.

## 1.6 යෙදවුම්

මෙම ව්‍යාපෘතිය සඳහා භාවිත මූලික යෙදවුම් වන්නේ නව බීජ වර්ග, පැළ වර්ග, යතුරු වර්ග, තාක්ෂණික උපකරණ, ව්‍යාප්ති සේවා දැනුම හා උපදේශන සේවා, විශේෂඥ ඥානය, මුදල් යනාදිය වේ.

මේවා බොහොමයක් එම ගම් ප්‍රදේශයන්හි අදාල ආයතන මගින් ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් යටතේ ලබා දෙනු ලබන ඒවා වන අතර ව්‍යාපෘතිය යටතේ ඒවා ජනතාව වෙත ක්‍රමවත් හා වඩාත් ඵලදායී වන ආකාරයෙන් බෙදා හැරීමට කටයුතු සැලසේ. ඊට අමතරව ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති මුදල් මගින් ද බීජ හා පැළ වර්ග යම්කිසි ප්‍රමාණයක් ජනතාව වෙත ලබා දීමට කටයුතු කෙරේ.

## 1.7 නිමවුම්

වැඩසටහනින් අපේක්ෂිත නිමවුම් වන්නේ විවිධ වගාවන් යටතේ ඇති වපසරිය හා යටි වගාව, මිශ්‍ර වගාව හා නව තාක්ෂණික ක්‍රම භාවිත වපසරිය වැඩිවීම, ස්වයං රැකියා ඒකක වැඩිවීම, නිෂ්පාදනය වැඩිවීම යනාදියයි.

## 1.8 සම්බන්ධීකරණය

මෙම අධ්‍යයනය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් සම්බන්ධීකරණය කරනු ලබන අතර කෘෂිකර්ම හා පශු සම්පත් හා සමෘද්ධි අමාත්‍යාංශය මෙන්ම සෙසු අමාත්‍යාංශවලට අයත් දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අදාල ප්‍රදේශවල පිහිටි රාජ්‍ය නොවන ආයතනවල සහයෝගයෙන් ක්‍රියාත්මක කෙරේ.

## 1.9 මූල්‍ය පහසුකම් සැපයීම

වැඩසටහන සම්බන්ධීකරණය කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම සිදු කරනු ලබන්නේ සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට අයත් සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල මගිනි. මේ සඳහා රු. දශ ලක්ෂ 4.3 ක මුදලක් ලබා දී තිබේ.

මීට අමතරව ඇතැම් ගම්වල ඉදිකිරීම් කටයුතු සඳහා ද එමගින් මුදල් වැය කර ඇත. එම ප්‍රමාණය රු. දශ ලක්ෂ 0.7 කි. මීට අමතරව කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය රු. දශ ලක්ෂ 10 ක මුදලක් වැව් හා ප්‍රවාහන පද්ධතීන් පුනරුත්ථාපනය හා කෘෂි ළිං ඉදිකිරීම ඇතුළත් පාදක ව්‍යුහය දියුණු කිරීමට ලබා දී ඇත.

## 1.10 ව්‍යාපෘති ප්‍රදේශ තෝරා ගැනීම

ව්‍යාපෘති ප්‍රදේශ තෝරා ගැනීමේ දී විවිධ කෘෂි දේශගුණික කලාපයන් මෙන්ම (වී, අර්තාපල්, ළොකු ලූනු, මිරිස්, උඩරට එළවළු, මුං ඇට/කව්පි වැනි) විවිධ බෝග හා (සත්ව පාලනය වැනි) ආර්ථික කටයුතු නියෝජනය වන ආකාරයට කටයුතු කර ඇත. ඒ අනුව (උතුරු මැද ටාට, මධ්‍යම, වයඹ ආදී) පළාත් 4 ක් හා (පොළොන්නරුව, මොණරාගල, බදුල්ල, කුරුණෑගල, මාතලේ, අනුරාධපුරය, නුවරඑළිය, පුත්තලම යනාදී) දිස්ත්‍රික්ක 8 ක් නියෝජනය වන ආකාරයෙන් ග්‍රාමසේවා වසම් 9 ක් තෝරාගෙන ඇත. එසේ තෝරාගත් ගම් හා අදාල විස්තර ඇමුණුම 1 හි ඇති අංක 1 වගුවෙහි සඳහන් වේ.

## 1.11 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ආයතනයේ කාර්යභාරය.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 2002 වසරේ අවසාන කාර්තුව තුලත් 2003 වසර මුල්ලේත් හෙ.කො.ගො.ප.පු.ආයතනයේ සම්පූර්ණ ශක්තිය හා කැපවීම සිදු කර ඇත. මේ වෙනුවෙන් ආයතනයේ සියළුම අංශයන් හි සිටින පර්යේෂණ නිලධාරීන් මෙන්ම පර්යේෂණ සහාය කාර්ය මණ්ඩලයත් මහත් පරිශ්‍රමයක් දරා ඇත. ඒ අනුව ඒ ඒ ව්‍යාපෘති ගම්මාන යටතේ ඇති සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා (සම්බන්ධීකරණ නිලධාරියෙකු/නිලධාරිනියක ලෙස) පර්යේෂණ නිලධාරියෙකු/නිලධාරිනියක බැගින් පත් කර ඇත. ඔහුගේ හෝ ඇයගේ සහායට තවත් පර්යේෂකයකු පත් කර සිටී. මීට අමතරව ඒ ඒ ව්‍යාපෘති ගම්වල සිදු කරනු ලබන සංවර්ධන කටයුතු සඳහා සහාය වීමට සංඛ්‍යාන නිලධාරී හා සංඛ්‍යාන සහකාරවරුන් එක් අයෙකු හෝ දෙදෙනෙකු පත් කර සිටිති. සියළුම ගම්මාන හෙවත් උප ව්‍යාපෘතීන් ඇතුලත් මුළු වැඩසටහනම සම්බන්ධීකරණය කිරීම කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශයෙන් සිදු කරනු ලබන අතර ඒ සඳහා එක් සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කර සිටී. ආයතනයේ අධ්‍යක්ෂ තුමා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ තුමා උපදෙස් සැපයීමෙන් එය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය දක්වති. මෙම ව්‍යාපෘතිය හා ඒ යටතේ ඇති උප ව්‍යාපෘතීන් (ව්‍යාපෘති ගම්) සම්බන්ධයෙන් විවිධ වගකීම් කරනු ලබන නිලධාරීන්/නිලධාරිනියන්ගේ නම් ඇමුණුම 1 යටතේ ඇති අංක 2 වගුව මගින් ඉදිරිපත් කර ඇත.

## 1.12 මෙම අගැයීම් අධ්‍යයන වාර්තාව

මෙම වාර්තාවෙන් හෙළි දැක්වෙන්නේ තිරසර වැඩසටහනෙහි එක් ව්‍යාපෘති ප්‍රදේශයක් වූ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොතානේගම ග්‍රාම නිලධාරී වසම පදනම් කර ගනිමින් ක්‍රියාත්මක කළ වැඩසටහන ඇගයුමට භාජනය කිරීම තුලින් ලබාගත් තොරතුරු ය. අදාල ව්‍යාපෘති ප්‍රදේශයේ මූලික සමාජ ආර්ථික ලක්ෂණ, සම්පත්, ප්‍රශ්න හා ගැටළු යනාදියත්, ව්‍යාපෘතිය යටතේ එහි ක්‍රියාත්මක කරන ලද කටයුතුත්, ඒවායේ ප්‍රතිඵල හා අපේක්ෂිත ව්‍යාපෘති අරමුණු

කරා ලඟා වීම සඳහා ඒවා කොපමණ දුරට උපකාරී වූවා ද යන්නත්, ව්‍යාපෘතියට මුහුණදීමට සිදු වූ ගැටළු යනාදියත්, එය ක්‍රියාත්මක කිරීමෙන් ලබාගත් පාඩම් හා අත්දැකීම් යනාදියත් මෙමගින් ඉදිරිපත් කෙරේ.

පොතානේගම ව්‍යාපෘති බල ප්‍රදේශයේ පහළ සියඹලෑව සහ පොතානේගම යන ප්‍රධාන කොටස් දෙක සඳහා වෙන වෙනම සමීක්ෂණ තොරතුරු ලබා ගන්නා ලද අතර අදාල විශ්ලේෂණය පිළියෙල කර ඇත්තේ ඒ අනුව ය.

## 1.13 ක්‍රමවේදය

මෙම වාර්තාව සැකසීමේ දී අදාල ව්‍යාපෘති ප්‍රදේශය පදනම් කර ගනිමින් සකසා ඇති පාදක සමීක්ෂණ වාර්තාව, එහි වාසය කරන ජනතාව සම්බන්ධ කර ගනිමින් සිදු කරනු ලැබූ සහභාගිත්වය ගැමි විමසුම් අභ්‍යාසය, ගම වෙත ඒ ඒ අවස්ථාවන්හි දී පිවිසීමේ දී කරනු ලැබූ නිරීක්ෂණ ව්‍යාපෘතියට විවිධ අත්දැකීම් පදනම් කර ගනිමින් වරින් වර සකස් කරනු ලැබූ ප්‍රගති වාර්තා යනාදිය පදනම් කර ගනු ලැබිණ.

## 2 පරිච්ඡේදය

<u>පිහිටීම</u>

පොතානේගම ග්‍රාම නිලධාරි වසම පිහිටා ඇත්තේ කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ය. පොතානේගම කුඩා වැව් දහසයකින් පෝෂණය වන ගොවි බිම්වලින් යුතු වන අතර පැතුරුම වර්ග කිලෝ මීටර් 08 පමණ වේ. ග්‍රාම නිලධාරි වසම ප්‍රධාන වශයෙන් ගම්මාන දෙකකින් යුතු වන අතර. ඉන් විශාල ගම්මානය පොතානේගම වන අතර අනෙක පහළ සියඹලෑව වේ.

<u>ඓතිහාසික තත්ත්වය.</u>

පොතානේගම පැරණි රජ දවස සිටම පැවතෙන ඓතිහාසික ගම්මානය කි. රිස්වෙහෙර විහාර භූමි ප්‍රදේශයට යාබදව පිහිටා ඇති පොතානේගම වාසීන් සියල්ලෝම බෞද්ධ සිංහල ජනතාව වන අතර, සියළුම පවුල් රිස්වෙහෙර විහාරයෙහි දායක කොටස් වෙති. පොතානේගම කොටසෙහි ජීවත් වන පවුල් පාරම්පරික ගම් වැසියන් වන අතර පහළ සියඹලෑවේ ජීවත් වන්නෝ පසු කලෙක යාබද ගම්වලින් පැමිණ පදිංචි වූවෝ වෙති.

පහළ සියඹලෑවේ නිවැසියන් සියල්ලෝ ම යාබද ගමක් වන කුඹුක්කඩවල පාරම්පරික ගැමියන්ගේ දෙවන තුන්වන පරම්පරාවට අයත් වෙති.

<u>ජනගහණය හා එහි ලක්ෂණ.</u>

පොතානේගම ග්‍රාම නිලධාරි වරයාගේ සංඛ්‍යාලේඛනවලට අනුව බල ප්‍රදේශයේ ජීවත් වන පවුල් සංඛ්‍යාව 205 කි. එහෙත් ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා පදනම් සමීක්ෂණය කරන අවස්ථාව වන විට ගමේ පදිංචි වී සිටියේ පවුල් 181 ක් පමණි. ඇතැම්හු තාවකාලිකව ගමින් පිටව ගොස් සිටි අතර, තවත් අය විවිධ හේතු මත සමීක්ෂණ කාලය තුල දී ක්ෂේත්‍ර නිලධාරීන්ට මුණගැසිය නො හැකි විය. මේ නිසා සමීක්ෂණයේ තොරතුරු පදනම් වී ඇත්තේ පදනම් සමීක්ෂණය කරනු ලැබූ කාල වකවානුව තුළ දී ගම තුල පදිංචි වී සිටි පවුල් සංඛ්‍යාව මත ය.

පොතානේගම ග්‍රාමසේවා බල ප්‍රදේශයේ පදිංචි වී සිටින පවුල් 181 හි සම්පූර්ණ ජනගහණය 768 කි. ඉන් පිරිමි ජන සංඛ්‍යාව 381 ක් වන අතර කාන්තා ජන සංඛ්‍යාව 387 ක් වේ. පොතානේගම පදිංචි පවුල්වලින් පවුලේ සංඛ්‍යාව පහට වඩා වැඩි පවුල්වල ප්‍රතිශතය 57% ක් වන අතර පහළ සියඹලෑවේ මෙම ප්‍රතිශතය 35% ට මදක් වැඩි ය. (කරුණාකර අමුණා ඇති වගු අංක 1, 1 ඊ බලන්න)

## ආර්ථික කටයුතු.

පොතානේගම ග්‍රාමසේවා වසමේ බහුතර ජනතාව කුඩා වැව් 16 මත පදනම් වූ වාරි කෘෂිකර්මයෙන් ද, හේන් වගාවෙන් ද ජීවනෝපාය සලසා ගනිති. තම ගම් ප්‍රදේශයෙන් පිටත කුඹුරු හා හේන් වගා කිරීමෙන් අතිරේක ආදායම් ලබා ගන්නා පවුල් ද වේ. ඇතැම් හු එවැනි පිටස්තර ඉඩම් අයිතිය පිළිබඳව නිවැරදි අදහස් ප්‍රකාශ කිරීමට අකමැත්තක් ඇති බැවින් ගමේ සියළු පවුල්වල ප්‍රතිශතයක් වශයෙන් පිට ගම්වල වගා කිරීම කොපමණදැයි නිවැරදිව තක්සේරු කළ නො හැකි ය. දළ වශයෙන් මේ ප්‍රමාණය 20% පමණ වන බව සාකච්ඡා වලදී හෙළිදරව් කර ගත හැකි විය.

පදනම් සමීක්ෂණයේ දී තොරතුරු එකතු කරන ලද පවුල් 181 න් 68% ක්ම සමෘද්ධි සහනාධාර ලාභීහු වෙති. (වගුව අංක 04) කෙසේ වෙතත් මොවුන්ගෙන් බොහෝ දෙනෙක් සමෘද්ධි සහන ලැබීමට තරම් පහත ආර්ථික මට්ටමක නො සිටින බව අපගේ නිරීක්ෂණය යි. ගෙවත්ත පමණක් ඇති කුඹුරු ඉඩම් හා හේන් ඉඩම් අහිමි ගම් වැසියෝ ද වෙති. මොවුන්ගේ අනුපාතය 5% පමණ වේ.

කෘෂිකර්මයට අමතර ව සත්ව පාලනයේ යෙදෙන්නෝ 40 දෙනෙකි. එළුහරක්, මී හරක්, එළුවන් හා කුකුළන් සුළු පරිමාණ වශයෙන් ඇති කිරීම සත්ව පාලනයේ ස්වභාවය වන අතර ඌරු පාලනයේ යෙදෙන්නෝ දෙදෙනෙකු වෙති.

පහළ සියඹලෑව වැසියන් එළ ගවයන් ඇති කරන නමුදු පානය සඳහා එළකිරි දොවා නො ගැනීම විශේෂ ලක්ෂණයකි. වියළි කාලයේ දී සතුන්ගේ ආහාර දුලබ වන නිසා කිරි දොවා ගැනීමට තරම් අකාරුණික විය නො හැකි බව ගැමියෝ කී හ. එහෙත් වරින් වර එකී ගවයන් මස් පිණිස විකිණීමට ඔවුන් පසුබට වන බවක් නො පෙනේ. ඒ ඒ ගව පට්ටි ප්‍රමාණයෙන් විශාල වන විට වැඩි වන සතුන් මසට විකිණීම කරයි. එහෙත් ඇතැම් ගැමියන් කියන්නේ වැස්සියන් මසට විකිණීම නො කරන බව යි.

රජයේ රැකියා කරන්නෝ ඉතා සීමිත ය. පවුල් 15 ක් පමණ රජයේ විවිධ රැකියාවල යෙදෙන අතර ඉනුත් වැඩි දෙනෙක් යුද හමුදාවේ සේවය කරති. කම්කරු, වඩු, පෙදරේරු වෘත්තීන්හි යෙදෙන අය පවුල් 12 කි. මේ අයගෙන් බොහෝ දෙනෙකු හේන් හෝ කුඹුරු වගාව ද කරති.

## සේවා වියුක්තිය.

පැහැදිලි සේවා වියුක්තියක් ගම තුළ නැති සියල්ලෝ ම යම් කාර්යයක යෙදී සිටිති. මහ කන්නයේ දී හේන් වගාව හා කුඹුරු වගාව එකට යෙදෙන අවස්ථාවල යම් මට්ටමක ශ්‍රම හිඟයක් ද ඇති වන බව ගැමියන්ගේ අදහස යි. එහෙත් කන්න අතර කාලවලදී හා නියං කාලවලදී සේවා වියුක්ති තත්ත්වයක් ඇති වේ. හොඳ වර්ෂාපතනයක් තිබේ නම් ගමේ සියල්ලෝ ම සේවා නියුක්තිකයෝ වෙති.

## අධ්‍යාපන තත්ත්වය

පහළ සියඹලෑව කොටසේ පාසැල් යන දරුවන් සංඛ්‍යාව 21ක් වූ අතර එය පිළිවෙළින් පිරිමි 12 ක්, ගැහැණු 9 ක් වශයෙන් විය. පොතානේගම පාසැල් යන දරුවන් ගැහැණු හා පිරිමි 89 බැගින් සිටින බව සමීක්ෂණයේ දී අනාවරණය විය. ගමේ පිහිටා ඇති පොතානේගම ප්‍රාථමික විද්‍යාලය ගමේ කුඩා දරුවන්ගේ අධ්‍යාපන අවස්ථා සපුරන එකම පාසැලයි. අඩු පහසුකම්වලින් සමන්විත මෙම පාසැලෙහි දැනට ඉගෙනුම ලබන්නේ 60 ක් පමණ වූ සුලු ශිෂ්‍ය සංඛ්‍යාවකි. ද්විතියික අධ්‍යාපනය සඳහා මෙම ගමට ආසන්නව පිහිටා ඇති විද්‍යාලය වන්නේ සැතපුම් 4ක් පමණ දුරින් පිහිටා ඇති කප්පෝරුව මහා විද්‍යාලයයි. මහා විද්‍යාලය ද උසස් පෙළ හදාරණ සිසුන් සඳහා ඇති විද්‍යාලයකි. එය මෙම ගමේ සිට සැතපුම් 8 ක් පමණ දුරින් පිහිටා ඇති අතර දුර්වල ප්‍රවාහන පහසුකම් හේතුවෙන් සිසුන්ට අධ්‍යාපන කටයුතු වල නියැලීමට සිදුවී ඇත්තේ ඉමහත් දුෂ්කරතා මධ්‍යයේ ය.(වගුව 2)

## නිවාස තත්ත්වය.

පහළ සියඹලෑව ගම්මානයේ නිවාස කුලී පදනමක් මත ජීවත් වන පවුල් ගණන 02 ක් පමණ පොතානේගම පවුල් 14 තමන්ට අයත් නොමැති නිවාසවල ජීවත් වෙති. ග්‍රා.සේ වසම සමස්තයක් ලෙස ගත් විට නිවාසවල තත්ත්වය එතරම් සතුටුදායක නැත. පහළ සියඹලෑවේ සමීක්ෂණයට ලක් කල නිවාස 29 න් 20 ක් ම මැටි බිත්තිවලින් නිම වූ ඒවා ය. පොතානේගම සමීක්ෂණයට ලක් වූ නිවාස 156 න් 48 ක්ම මැටි බිත්තිවලින් නිම වූ ඒවා ය. පොල් අතු සෙවිලිකල වහළ සහිත නිවාස 11 ක් පහළ සියඹලෑවේ තිබූ අතර එවැනි නිවාස පොතානේගම දී 31 ක් වාර්තා විය. පහළ සියඹලෑවේ සමීක්ෂණයට ලක් කල නිවාස 29 න් 23 ක්ම මැටි පොළවකින් යුතු වූ අතර පොතානේගම පවුල් 152 න් 102 ක්ම මැටි පොලව සහිත නිවාස විය. පහළ සියඹලෑව ගම්මානයේ නිවාසවල විශාලත්වය පිළිබඳව සලකා බැලූ විට නිවාස බිම් ප්‍රමාණය වර්ග අඩි 750 ඉක්ම වූ නිවාස තිබෙනනේ 4 පමණ ය. වර්ග අඩි 750 ඉක්ම වූ නිවාස පොතානේගම දී 16 ක් වාර්තා වී ඇත. ගම්මාන දෙකේම බහුතර නිවාස සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ වර්ග අඩි 200-400 ප්‍රමාණය අතර ය. (වගු අංක 6 සිට වගු අංක 11 ඒ දක්වා)

## සෞඛ්‍ය, සනීපාරක්ෂක පහසුකම් හා උපකරණ.

පහළ සියඹලෑවේ වාර්තා වී ඇති පවුල් 29 න් 16 කට ද, පොතානේගම වාර්තා කර ඇති පවුල් 152 න් පවුල් 77 කට ද කිසිදු ආකාරයක වැසිකිළියක් නොමැත. පහළ සියඹලෑවේ ජල මුද්‍රිත වැසිකිළි තිබෙන නිවෙස් 6 ක් ද, පොතානේගමින් ජලමුද්‍රිත වැසිකිළි තිබෙන නිවෙස් 50 ක් ද වාර්තා වී තිබේ. (වගු 12, 12 ඒ)

## නිවාස ආලෝක කිරීම

පහළ සියඹලෑවේ සියළුම වැසියන් භූමිතෙල්වලින් නිවාස ආලෝක කරන අතර පොතානේගම පවුල් 35 කට ප්‍රධාන විදුලිබලය ඇත. පවුල් දෙකක් සූර්ය බල ශක්තියෙන් නිවෙස් ආලෝක කර ගනී. සෙස්සෝ භූමිතෙල් මගින් නිවාස ආලෝක කරති. (වගුව 13,13 ඒ)

## ගෘහ උපකරණ හා ප්‍රවාහන උපකරණ අයිතිය.

පහළ සියඹලෑවේ බැටරි මගින් ක්‍රියාකරන රූපවාහිනී පවුල් 05 කට තිබේ. පොතානේගම විදුලියෙන් හෝ බැටරි මගින් ක්‍රියා කරන රූපවාහිනී තිබෙන පවුල් සංඛ්‍යාව 60 කි. ගම්මුන්ගේ ප්‍රධානතම ප්‍රවාහන මාධ්‍යය බයිසිකලයයි. පහළ සියඹලෑවේ පවුල්වලින් 75% ක්ටම බයිසිකල් හිමි අතර පොතානේගම එම සංඛ්‍යාව 82% කි. ගුවන් විදුලිය ප්‍රධානතම සංනිවේදන මාධ්‍යය වන අතර ගුවන් විදුලි යන්ත්‍ර හිමි සංඛ්‍යාව පිළිවෙලින් 41% හා 65% ක් විය. (වගු අංක 14, 14ඒ)

## ප්‍රජා සංවිධාන

පහළ සියඹලෑවේ ශක්තිමත් ගොවි සංවිධානයක් ඇති අතර එහෙත් පොතානේගම ගොවි සංවිධානය එතරම් ශක්තිමත් නැත. පහළ සියඹලෑවේ ගොවි සංවිධානයේ සාමාජික මුදල් ගෙවන්නේ පවුල් 18 ක් පමණි. නමුත් සියල්ලෝම රැස්වීම්වලට පැමිණෙති. පොතානේගම පවුල් 107 එම සංවිධානයේ සාමාජිකත්වය ලබා ඇත. කුඹුරු ඉඩම් හිමියන් නොවීම සාමාජිකත්වය නො ගැනීමේ ප්‍රධාන හේතුව ලෙස ඔවුන් දක්වයි. ගොවි සංවිධානවලට අමතරව මරණාධාර සමිති, විහාර සංවර්ධන සමිති, පාසැල් සංවර්ධන සමිති හා සමෘද්ධි සමිති පිළිබඳව ගම්මාන දෙකෙන්ම වාර්තා වේ. තරුණයන් සඳහා විශේෂ සංවිධානයක් හෝ වැඩපිළිවෙලක් පිළිබඳව වාර්තා වී නැත. (වගු අංක 29, 29 ඒ)

## පානීය ජලය

ව්‍යාපෘති බල ප්‍රදේශයේ ගොවීන් බීම සඳහා ජලය ලබා ගන්නා ප්‍රධාන ජල මූලාශ්‍රයන් වනුයේ නළ ළිං සහ පොදු ළිං ය. පහළ සියඹලෑව කොටසේ පොදු ළිං නොමැති අතර එහි පවුල්වලින් බහුතරයක් ම (13 ක් ) නළ ළිං වලින් බීම සඳහා අවශ්‍ය ජලය ලබා ගනී. තම පෞද්ගලික ළිං වලින් ජලය ලබාගන්නා සංඛ්‍යාව 3 ක් ලෙස වාර්තා වුනි. බොහෝ පවුල් තමනට ළිං නොමැති වීම නිසා අසල්වැසි ළිං වලින් තම බීම සඳහා අවශ්‍ය ජල අවශ්‍යතා සපුරා ගනී. එය පහළ සියඹලෑව සහ පොතානේගම පිළිවෙලින් 49% ක් හා 53% ක් විය. පහළ සියඹලෑවේ ගොවි පවුල් වලින් බහුතරයක් (26 ක් ) (89% ක්) නෑම සඳහා සියඹලංගමුව ඔය භාවිතා කරයි. පහළ සියඹලෑව ගම සියඹලාංගමුව ඔය ආසන්නව පිහිටා තිබීම මෙයට ප්‍රධාන හේතුව ලෙස පෙන්වා දිය හැක. පොතානේගම කොටසේ වැසියන් බහුතරයක් එනම් 92% ක් පමණ නෑම සඳහා වැව් භාවිතා කරයි. මේ කොටසේ වැව් කිහිපයක්ම පිහිටා තිබීමත්, මහවැලි ජලයෙන් පෝෂිත කුඩා කත්නොරුව වැව ආසන්න වීමත් මේ තත්ත්වයට හේතු වේ. (වගු අංක 15, 15 ඒ)

පුස්තකාලය
LIBRARY
HARTI



21456

## ඉඩම් අයිතිය.

පහළ සියඹලෑවේ පදිංචි ගැමියන්ගෙන් අක්කර 1/2 ට අඩු ගෙවත්තක් ඇති තැනැත්තන් සිටින්නේ එක් අයෙකු පමණි. අක්කරයකට අඩු කුඹුරු ඉඩම් ඇති අය කිසිවෙකු නො සිටී. අක්කර 5 ට වැඩි කුඹුරු ඉඩම් ඇති අය 06 දෙනෙකු ද, අක්කර 5 ට වැඩි ගොඩ ඉඩම් ඇති අය 20 දෙනෙකු ද සිටී. (වගු අංක 16)

පොතානේගම අක්කර 1/2 ට වඩා කුඩා ගොඩ ඉඩම් ඇති අය 5 දෙනෙක් ද අක්කර 1/2 අඩු කුඹුරු ඉඩම් ඇති අය 01 ද සිටී. අක්කර 05 ට වැඩි කුඹුරු ඉඩම් හිමියෝ 28 කි. අක්කර 05 ට වැඩි ගොඩ ඉඩම් හිමියෝ 71 දෙනෙකි. ගම් දෙක තුළ ම උග්‍ර ඉඩම් හිඟයක් දක්නට ලැබෙන්නේ නැත. (වගු අංක 16 ඒ)

## කෘෂිකර්මය.

ප්‍රධාන වශයෙන් කෘෂිකර්මය වාරි කෘෂිකර්මය හා හේන් වගාවයි. සියළුම කුඹුරු හිමියෝ වර්ධනය කරන ලද බීජ වගා කරති. පොහොර භාවිතය දෙපාර්තමේන්තු නිර්දේශයකට වඩා තරමක් වැඩි ය. යූරියා හැරුණු විට අනෙකුත් පොහොර භාවිතා කරන්නේ ඉතාමත් සුළු වශයෙනි. වී වගාවේදී වර්ධනය කරන ලද බීජ යොදා ගනු ලැබුවත් හේන් වගාවේ බීජ තවමත් සාම්ප්‍රදායික ය. පාදක සමීක්ෂණය අනුව රජයේ කෘෂි ව්‍යාප්ති සේවාව ගමට පැමිණෙන්නේ ම නැත. රෝග පීඩා හා පොහොර කෘමිනාශක පිළිබඳව ගැමියන් තොරතුරු ලබාගන්නේ වෙළෙන්දන් ගෙනි. හේන් වගාවේ දී රටකජු, තල, මිරිස්, මුං, කව්පි, බඩ ඉරිඟු, වට්ටක්කා ආදිය සුලභව වගා කරන අතර ජලය ලබාගත හැකි සියඹලන් ඔය ආශ්‍රයේ ඇති ඉඩම්වල ලොකු ලූණු හා බිට් වගා කරන්නෝ ද වෙති. මෙවැනි ගොවින් සිටින්නේ 10 - 05 අතර සංඛ්‍යාවකි. එක් කන්නයක මෙවැනි බෝග වගා කරන්නෝ ද ඊළඟ කන්නවල නොකඩවා වගා කිරීමක් දක්නට නො ලැබේ. මුදල් තත්ත්වය, ජල පහසුකම් හා පවුලේ සමාජ - ආර්ථික කරුණු මත වගාව තීරණය වේ.

ගම්වැසියෝ පදිංචිව සිටින ඉඩම්වල පොල්, කෙසෙල්, තක්කාලි, දෙහි, දොඩම්, අඹ, පැපොල් ගෘහ පරිභෝජනය සඳහා සුළු වශයෙන් වගා කරනු ලබන අතර දෙහි සහ දොඩම් මුදල් ඉපයීම සඳහා වගාකරන්නෝ ද වෙති.

කෘෂිකාර්මික හෝ වෙනත් කිසිදු අවශ්‍යතාවයක් සඳහා ණය ලබා ගැනීමේ පුරුද්දක් පහළ සියඹලෑව ගම්වැසියන්ට නැත. පදනම් සමීක්ෂණයේ දී ලැබුණු තොරතුරු අනුව පහළ සියඹලෑවේ ණය ලබාගත් පවුල් සිටියේ එකක් පමණි. එහෙත් පොතානේගම තත්ත්වය තරමක් වෙනස් ය. පවුල් 33 ක් යම් කරුණක් සඳහා ණය ලබාගෙන තිබූ බව පදනම් සමීක්ෂණයේ දී සොයාගත හැකි විය. ඉන් වැඩි ප්‍රමාණයක් ණය ලබාගෙන තිබුනේ කෘෂිකාර්මික කටයුතු සඳහායි.

වැඩිම ප්‍රමාණයක් ණය ලබාගෙන තිබුණේ සමෘද්ධි බැංකුවෙන්. එහි සංඛ්‍යාව 15 කි. වානිජ බැංකුවලින් ණය ලැබූ අය තිදෙනෙකු පිළිබඳව වාර්තා විය. ගොවි බැංකුවෙන් ණය ලැබූ සිටි දෙනෙකු පිළිබඳව තොරතුරු වාර්තා විය. (වගු 23, 23 ඒ සහ 24, 24 ඒ)

<u>සත්ව පාලනය</u>

සත්ව පාලනය ප්‍රධාන ආර්ථික කටයුත්තක් නො වේ. පහළ සියඹලැවේ 12 දෙනෙකු ද, පොතානේගම 28 දෙනෙකු ද අතිරේක ආර්ථික කටයුත්තක් වශයෙන් සත්ව පාලනයේ යෙදෙති. ව්‍යාප්ත සේවාවන්වල සේවය නොලැබීමත්, සතුන් සඳහා අවශ්‍ය කෑම සපයා ගැනීමේ අපහසුවත් උසස් වර්ගයේ සතුන් ලබා ගැනීමට හැකියාවක් නොමැති වීමත් සත්ව පාලනය සම්බන්ධව මෙම ගොවීන් මුහුණ දෙන ප්‍රධානතම ගැටලු ලෙස පෙන්වා දුනි. (18, 18 ඒ සහ 20, 20 ඒ)

<u>ස්වයං රැකියා</u>

වඩු කර්මාන්තය, මිරිදිය මසුන් ඇල්ලීම (කාලීනව) සත්ව පාලනය අතර මැදි වෙළඳ කටයුතු වාර්තා වී තිබෙන ස්වයං රැකියාවන් හි පිළිගත් ස්වයං රැකියා ලෙස සටහන් නො වුව ද, ගොර මත්පැන් නිෂ්පාදනයෙන් ආදායම් උපයා යැපෙන පවුල් 02 ක් පිළිබඳ ව ද, පොතානේගමින් වාර්තා වේ. පහළ සියඹලැවේ කිසිවකු මෙම කර්මාන්තයේ නො යෙදේ.

<u>ආදායම් මට්ටම.</u>

පදනම් සමීක්ෂණයේ දී යොදවුම් වූ කරුණුවලට හා පර්යේෂකයන්ගේ නිරීක්ෂණවලට අනුව අදාළ ප්‍රදේශය තුළ උග්‍ර දිළිඳුකමක් නැත. බැලූ බැල්මට දිළිඳුකමින් පෙනෙන නමුත් ආහාරපාන අතින් ගැමියන් දැඩි හිඟයකට මුහුණ පා නැත. පහළ සියඹලෑව ගැමියන්ගෙන් 65% ක් පමණ අයට යම් ආකාරයක බැංකු ගිණුමක් තිබෙන අතර පොතානේගම ගැමියන්ගෙන් 78% ක පමණ බැංකු ගිණුම් තිබේ. ගැමියන්ගෙන් බහුතරයක් වානිජ බැංකුවල ගිණුම් පවත්වාගෙන යන අතර ඇතැම් හු සමෘද්ධි බැංකුව සමග ගිණුම් පවත්වාගෙන යාම ද දක්නට ලැබේ. 68% පමණ අනුපාතයක් ගැමියන් සමෘද්ධි සහන ලැබීම නිසා ඔවුන් අන්ත දිළින්දන් සේ සැලකීමට පදනමක් නොමැති බව පර්යේෂකයන්ගේ නිරීක්ෂණයයි. සැබෑ තත්ත්වය නම් 68% පමණ අනුපාතයක ගැමියන් අන්ත දිළින්දන් නො වන බව යි.

පහළ සියඹලැවෙන් ලැබූ තොරතුරු අනුව ගැමියන්ගෙන් 87% ක්ම ප්‍රධාන ආහාරවේල් තුනම ලබා ගැනීමට සමත් වන බව ප්‍රකාශ කර ඇති අතර පොතානේගමින් වාර්තා වී ඇති මෙම අනුපාතය 56% පමණ වේ. පොතානේගම වැසියන් බොහෝ දෙනෙකු හේන් වගාවේ යෙදෙන නියා වෘත්තියේ

ස්වභාවය අනුව දිවා ආහාරය ප්‍රධාන ආහාරයක් සේ නො ගැනීමට හේතු වන බව තොරතුරු පරීක්ෂා කිරීමේ දී හෙළි විය. රාත්‍රී හා උදේ ආහාර ප්‍රධාන ආහාර සේ සැලකීමට මොවුනු පුරුදු වී සිටිති. පහළ සියඹලැවෙන් දිවා ආහාරය ගැනීමට අසමත් එක් පවුලක් වාර්තා වී ඇත්තේත්, පොතානේගමින් පවුල් 27 ක්ම දිවා ආහාරය නො ගන්නා ලෙසත් වාර්තා වී ඇත්තේ මවුන්ගේ කෘෂිකාර්මික වගා පදනම් මත ය. වැඩි හේන් වගා කරුවන් ප්‍රමාණයක් ජීවත් වන්නේ පොතානේගම ප්‍රදේශය තුළ ය. ගැමියන්ගේ ආදායම් මට්ටම් පිළිවෙලට සලකා බැලීමේ දී වැඩි වැදගත්කමක් දිය යුතුව තිබෙන්නේ මුදල් ආදායමට වඩා ජීවන තත්ත්වයට බව පෙනේ. ආහාර වේල් තුනම ලබා ගැනීමට සමත් මොවුන්ගේ ආහාරවලින් පිටතින් ලැබෙන්නේ සීනි, ලුණු සහ කරවල පමණි. කුඹුරෙන් වී ද, හේනෙන් ධාන්‍යය ද, වැවෙන් හා කැලෑවෙන් මාළු හා මස් ද ලබා ගන්නා ගැමියෝ මුදල් වියදම් කරන්නේ සබන්, ඇඳුම්, ගිනිපෙට්ටි, භූමිතෙල්, ප්ලාස්ටික් බඩු ආදී වූ ද්‍රව්‍ය සහ ගෘහ උපකරණවලට පමණක් බව සොයා ගත හැකි විය. මවුන්ගේ ද්‍රව්‍ය නිෂ්පාදන මුදල් බවට පරිවර්තනය කළ විට අවශ්‍යයෙන්ම 75% වඩා වැඩි පිරිසක් දිළිඳුකමට හසු වූවන් සේ විස්තර කළ නො හැකි ය.

## කෘෂිකර්මයේදී මුහුණ දෙන ගැටලු

ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික ජීවිතයක් ගත කරන මෙම වැසියන් මුහුණ දෙන ප්‍රධානතම ගැටලුව වන්නේ කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රමාණවත් ජලය නොමැති වීමයි. කුඩා වැව් 16 ක්ම තිබුණ ද ඒවායින් කුඹුරු ගොවිතැන් කළ හැකිවන්නේ මහ කන්නයේ පමණි. යල කන්නය සඳහා ප්‍රමාණවත් ජලයක් නොමැත. යල කන්නයේ දී ද මහ කන්නයේ දී ද වැසි ජලය උපයෝගී කරගෙන සිදු කරන අමතර බෝග වගාවේ යෙදුනත් නිතර මුහුණ දෙන නියඟය නිසා වගාවන් පාලු වන අවස්ථා ද ඇත. පොතානේගම කොටසේ වැසියන් මුහුණ දෙන ප්‍රධානතම ගැටලුව වන්නේ වල් අලි උවදුරයි. රැස්වෙහෙර ආසන්නයේ කැලෑවල අලින් නිසා නිතර මෙම වැසියන්ගේ ගොඩ බෝග වගාවන් විනාශ කරනු ලබයි. එසේම අලෙවි පහසුකම් නොමැති වීම ද ගොවීන් මුහුණ දෙන තවත් ගැටලුවකි. මෙම ගම නගරයේ සිට ඈතින් පිහිටා ඇති නිසා ද, මාර්ග දුෂ්කරතා නිසා ද, වෙළඳුන් පැමිණීම සීමා වේ. එසේ පැමිණියත් ඔවුනට තම නිෂ්පාදන අලෙවි කිරීමට සිදුවන්නේ අඩු මිලකට බව ගොවීන් පවසයි. (වගු අංක 17, 17 ඒ)

## ගම සංවර්ධනය කිරීමට ඇති බාධා

මෙම ගමේ සංවර්ධනයට ඇති බාධාවන් පිළිබඳව සමීක්ෂණයේ දී තොරතුරු විමසනු ලැදී. එහිදී සියඹලැව කොටසේ බහුතරයකගේම පිළිතුර වූයේ මාර්ග අපහසුතාවයන් ය. පහළ සියඹලැව ආසන්න කුඹුක්කඩවල හරහා මොරගොල්ල නගරයට යාමට ඔය හරහා පාලමක් නොමැති වීම මෙයට ප්‍රධාන හේතුව ලෙස පෙන්වා දුනි. වැසි දිනවලදී ඔය හරහා ගමන් කිරීම කිසිසේත්ම කළ නොහැක. පොතානේගම වැසියන් පෙන්වා දුන්නේ ජලය හිඟකම සංවර්ධනය වීමට ඇති ප්‍රධාන බාධාවන් බවයි. මාර්ග අපහසුතා පැවතීම ද සංවර්ධනයට බාධාවක් බව බහුතරයක් පෙන්වා දුනි. (73%) එසේම රාජ්‍ය නිලධාරීන්ගේ සහයෝගයක් නොමැඅති බව 31% ක් පෙන්වා දුනි. එසේම සංවර්ධනයට ඇති ප්‍රධාන

බාධකයක් ලෙස දේශපාලන හේතූන් ඇති බව පොතානේගම වැසියන් 49% කගේ මතය විය. (වගු අංක 30, 30 a)

<u>ගම සංවර්ධනය කිරීමේ දී ප්‍රමුඛත්වය දිය යුතු කරුණු (ගම් වැසියන්ගේ යෝජනා)</u>

පහළ සියඹලැව කොටසේ වැසියන් සියඹලංගමුව ඔය හරහා පාලමක් අවශ්‍ය බව විශේෂයෙන් අවධාරණය කරන ලදී. විශේෂයෙන් මොරගොල්ලාගම නගරයට හෝ කුරුණෑගල නගරය කරා ඒමේදී මෙම මාර්ගය පහසුවීම එවැනි යෝජනාවක් ඉදිරිපත් වීමට ප්‍රධාන හේතුවයි. පාලමක් නොමැතිවීම මත ඔවුන් විශාල දුෂ්කරතාවයන් රාශියකට මුහුණ දෙයි. එසේම කෘෂිකර්මය හා බීමට අවශ්‍ය ජල පහසුකම් ලබා ගැනීම ද වැඩි පිරිසකගේ (96%) යෝජනාවක් විය. 34% ක් විදුලි බලය අවශ්‍ය බව ප්‍රකාශ කරන ලදී.

පොතානේගම කොට්ඨාශයේ බහුතරයකගේ යෝජනාව වූයේ කෘෂිකාර්මික කටයුතු සහ බීම සඳහා ජල පහසුව අවශ්‍ය බවයි. කෘෂිකාර්මික දිවිපෙවෙතක් ගත කරන මෙම ගොවීන් නිතර ජල හිඟයෙන් පෙළීම මෙවැනි යෝජනාවක් ඉදිරිපත් වීමට හේතු විය. 46% ක්ම ගමට විදුලි බලය ලබා දිය යුතු බව යෝජනා කරන ලදී. (වගු අංක 31, 31 a)

# තුන්වැනි පරිච්ඡේදය.

## ප්‍රවේශය

පොතානේගම තිරසර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගො.ප.පු.ආයතනයේ ප්‍රවිෂ්ඨ වීම මුල්මනින් ම ව්‍යාපෘති බල ප්‍රදේශයේ දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය හා ක්ෂේත්‍ර නිලධාරීන් මගින් ම සිදු කිරීමට කටයුතු කරනු ලැබින. ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලයේ උපදෙස් මත ඇහැටුවැව ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරී විසින් තෝරා ගනු ලැබූ කෘ.ප.නි. ස. වරයෙකු මූලික මැදිහත්වීම සඳහා තෝරා ගනු ලැබූ අතර ආරම්භක අවස්ථාවේ ගැමියන් වෙත ව්‍යාපෘති පණිවිඩය ගෙන යන ලද්දේ ඔහු විසිනි. අනතුරුව ග්‍රා. නි. හා සමෘද්ධි නිලධාරී යන ක්ෂේත්‍ර නිලධාරීන් දෙදෙනා ද ව්‍යාපෘතිය පිළිබඳව ගැමියන් දැනුවත් කර ගැනීම සඳහා යොදවා ගන්නා ලද අතර ව්‍යාපෘතිය දියත් කරුවන් පවත්වන ලද සමාරම්භක රැස්වීම සියළුම ගැමියන්ගේ ද අදාල සියළු රාජ්‍ය නිලධාරී වරුන්ගේ ද සහභාගිත්වයෙන් ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

ව්‍යාපෘතියේ සමාරම්භක රැස්වීම ගරු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලැබූ කරුණු කීපයක් නිසා වැදගත් විය. එක් අතකින් රාජ්‍ය නිලධාරීන්ගේ හොමඳ සහයෝගය ව්‍යාපෘතිය සඳහා ලබා ගැනීමටත්, තවත් අතකින් ගැමියන් තුළ උද්යෝගයක් ඇති කිරීමටත්, එමෙන්ම ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය අනුග්‍රහයක් ඇති බව සහභාගිවීමටත් සමාරම්භක රැස්වීම හේතු වූ බව ඉතා පැහැදිලි ය.

පොතානේගම ග්‍රා.සේ. වසම තුළ වෙන් වෙන් ව ක්‍රියාත්මක වූ ගොවි සංවිධාන දෙකක් තුබූ බැවින් එක් එක් ගොවි සංවිධානය අදාල සංවර්ධන කටයුත්තට මෙහෙයවීම සඳහා ගොවීන් දැනුවත් කිරීම සිදු කරන ලදී. මූලික දැනුවත් කිරීම සඳහා පවත්වන ලද සමාරම්භක රැස්වීමෙන් අනතුරුව රැසවීම් වාර කීපයක් මේ සඳහා යොදා ගන්නා ලදී.

## සහභාගිත්ව ගැමි විමසුම.

තිරසර සංවර්ධන වැඩසටහනේ මූලික අඩිතාලම යොදන ලද්දේ සහභාගිත්ව ගැමි විමසුමක් මගින් කරනු ලැබූ තොරතුරු රැස් කිරීමක් මත සැලසුම් කරන ලද සංවර්ධන සැලැස්මක් මගිනි. සහභාගිත්ව ගැමි විමසුම සඳහා සියළුම ගැමියන් මෙන්ම ක්ෂේත්‍ර, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් රාජ්‍ය නිලධාරී වරු ද, හෙ.කො. ආයතනයේ නිලධාරී වරු ද සහභාගි වූහ. සහභාගිත්ව ගැමි විමසුම මගින් හොනු කරනු ලැබූ ගැටළු ලැයිස්තුව හා ඒ සඳහා ගෙන එනු ලැබූ යෝජනා ද, ගැටළුවල ප්‍රමුඛතාව මත පහත දැක්වේ.

## සැලසුම් සැකසීම

හඳුනා ගනු ලැබූ ගැටලු හා ඒවායේ ප්‍රමුඛතාව මත පදනම් ව එක් වසරක් සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කරන ලද අතර සංවර්ධන සැලැස්ම රාජ්‍ය නිලධාරීන්ගේ සහයෝගය ඇති ව ගැමියන් විසින් ම ක්‍රියාවට නැගීමට තීන්දු විය. පහළ සියඹලැව ප්‍රදේශයේ ප්‍රමුඛතම ගැටළු අතර සියඹලාන්ඩුව හරහා පාලමක් නො මැති වීමෙන් පැවැති මාර්ග දුෂ්කරතාව යි. පොතානේගම ප්‍රමුඛතම සංවර්ධන උවමනාව ලෙස හඳුනා ගනු ලැබුයේ ප්‍රදේශයේ කුඩා වැව් 16 ට ම ජලය ලබාගැනීමට හැකි වන පරිදි සියඹලාන්ඩුව හරස් කර අමුණක් බැඳීමේ යෝජනාවයි.

## සංවිධානාත්මක කළමනාකරණය.

සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ක්‍රියාත්මක සංවිධානවලට අමතරව යම් උපකමිටු පිහිටුවා ගැනීමක් ද සිදු වූ අතර එකී උපකමිටු එක් එක් සංවර්ධන වැඩකටයුතු සඳහා විශේෂ ප්‍රමුඛත්වයක් ගත යුතු බවට තීන්දු විය.

## ජනතා සහභාගිත්වය ලබා ගැනීමේ උපක්‍රම

වැඩසටහන් සඳහා ජනතා සහභාගිත්වය ලබා ගැනීමේ මූලික උපක්‍රම තුනක් ක්‍රියාවට නැගුනි.

## විශ්වාසය තහවුරු කිරීමේ ක්‍රමය

විශ්වාසය තහවුරු කිරීමේ උපක්‍රමය යටතේ ගොවීන් වෙත ඇති කරන ලද විශ්වාසයන්ගෙන් එකක් නම් නිලධාරීන් හා ගොවීන් අතර විශ්වාසය තහවුරු කිරීම යි. ගොවීන් - ගොවීන් පිළිබඳව විශ්වාස කරවීම ද, රාජ්‍ය සේවාවන් හා ගොවීන් අතර විශ්වාසය තහවුරු කරවීම ද මේ උපක්‍රමය මගින් සිදු විය.

## ප්‍රතිලාභ සහතික කිරීම

ව්‍යාපෘතියේ ප්‍රතිලාභ අත්පිට ම අත්දැකිය හැකි පරිදි කටයුතු කිරීම තවත් එක් උපක්‍රමයක් විය.

උදාහරණ වශයෙන් පහළ සියඹලැව ගැමියන් විසින් හඳුනාගත් ප්‍රමුඛතම ගැටළුව වූ මාර්ගය යා කෙරෙන පාලමක් ඉදිකිරීම යථාර්ථයක් බවට පත් කිරීමට නිරසර සංවර්ධන ව්‍යාපෘතියට හැකි විය. ප්‍රතිලාභ අත්දකින ගොවීහු ව්‍යාපෘතිය සඳහා දැඩි කැපවීමක් පෙන්නුම් කිරීම ඉතාමත් ස්වභාවික ය.

## ස්වියත්වය ඇති කිරීමේ උපක්‍රමය

මේ උපක්‍රමය මගින් සිදු කරන ලද්දේ අදාල ව්‍යාපෘතියේ තීරණ ගැනීම, තීරණ ක්‍රියාවට නැගීම හා වගකීම මුළුමනින් ම ජනතාවට හා අදාල ප්‍රදේශයේ නිලධාරීන් වෙතට ම පැවරීමෙන් අදාල ව්‍යාපෘතිය ඔවුන්ගේ ම ව්‍යාපෘතියක් බවට පරිවර්තනය කර පෙන්වීමයි. මේ උපක්‍රමය නිසා තිරසර සංවර්ධන ව්‍යාපෘතිය ඔවුන්ගේ අයිතිය හා බලය සහිත ව්‍යාපෘතියක් බවට ඇති වන හැඟීමෙන් ජන සහභාගිත්වය වර්ධනය කර ගැනීමට කටයුතු යොදන ලදි.



LIBRARY

# 3.4 ක්‍රියාත්මක කළ සංවර්ධන කටයුතු - පොතානේගම

## 1. පුහුණු පාඨමාලා, වැඩමුළු හා දේශන

| වැඩසටහන | මුදල්/විශේෂඥ සහාය හෝ වෙනත් සහාය ලබාදුන් ආයතනය |
|---|---|
| I. ඒකාබද්ධ පලිබෝධ නාශක වැඩසටහන 2003 යල කන්නය (පහළ සියඹලෑව ගොවීන් සඳහා සතිපතා පවත්වන පුහුණු වැඩසටහන) | කලාප කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, මහව. |
| II. ගෙවතු සංවර්ධන වැඩසටහන - පහළ සියඹලෑව | කලාප කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, මහව. |
| III. කොම්පෝස්ට් සෑදීම පිළිබඳ වැඩසටහන - පහළ සියඹලෑව | කලාප කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, මහව. |
| IV. පොතානේගම හා සියඹලෑව ගොවීන් සඳහා ක්ෂේත්‍ර චාරිකාව - ගෙවතු ආදර්ශන තවාන් ස්වයං රැකියා ආදිය නැරඹීම සඳහා | කලාප කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, මහව.<br>පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය,කුරුණෑගල |
| V. සියඹලෑව ගොවි කාන්තාවන් සඳහා ආහාර සකස් කිරීම පිළිබඳ ප්‍රජා වැඩසටහන | කලාප කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, මහව |
| VI. පාංශු සංරක්ෂණ පුහුණු වැඩසටහන - පහළ සියඹලෑව. | කලාප කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය -මහව |
| VII. පාංශු සංරක්ෂණ පුහුණු වැඩසටහන - පොතානේගම | කලාප කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය-මහව |

## 2. වගාවන් සහ වෙනත් කටයුතු පිළිබඳ ආදර්ශන

| | |
|---|---|
| 1. බිත්තර වී ආදර්ශන දෙකක් ආරම්භ කිරීම - පහළ සියඹලෑව වැව යටතේ | කලාප කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය, මහව. |

## 3. බීජ, ඇට, පැළ වර්ග හා වෙනත් ද්‍රව්‍ය හා උපකරණ බෙදා දීම.

| | | |
|---|---|---|
| I. | ගෙවතුවල සිටුවීම සඳහා පේක්ස පැළ 4000 ක් බෙදා දීම එක් නිවසකට පැළ 20 බැගින් පවුල් 200 කට බෙදා දෙන ලදී. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, කුරුණෑගල. |
| II. | ගෙවතු වගා යටතේ ගම්මිරිස් පැළ 600 ක් සහ කොපි පැළ 200 ක් පවුල් 200 ක් අතර බෙදා දීම සහ එම වගාව පිළිබඳව ක්ෂේත්‍ර පුහුණුවක් ලබාදීම. | අපනයන බෝග දෙපාර්තමේන්තුව,කුරුණෑගල. |
| III. | අඳ ක්‍රමය යටතේ ඇති කිරීම සඳහා එළුවන් ලබා දීම | සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව, ගල්ගමුව කාර්යාලය. |

## 4. වැව් අමුණු හා වෙනත් ප්‍රතිසංස්කරණ.

| | | |
|---|---|---|
| 1. | පහළ සියඹලෑව වැව ප්‍රතිසංස්කරණ වැඩසටහන (ව්‍යාපෘතියේ ඉල්ලීම මත ගොවිජන සේවා කාර්යාලය මගින් මෙම වැව තෝරා ගන්නා ලදී) | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සහ ලෝක ආහාර වැඩපිළිවෙල |
| 11. | සියඹලෑව දක්වා දිවෙන මාර්ගය පුළුල් කිරීම | ප්‍රාදේශීය සභාව, ගල්ගමුව |

## 5.අලුතින් ඉදිකිරීම්.

| | | |
|---|---|---|
| 1. | සියඹලංගමුව ඔය හරහා තැලවිල්ලක් ඉදිකිරීම | සමෘද්ධි සංවර්ධන අරමුදල. |
| 11. | කාර්යාල සංකීර්ණයක් සහිත ප්‍රජා ශාලාවක් ඉදිකිරීම. - පොතානේගම (දැනට සිදු කරමින් පවතී) | කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය<br>ප්‍රාදේශීයලේකම් කාර්යාලය,ඇහැටුවැව. |
| 111. | පොතානේගම - සියඹලෑව දක්වා විදුලි යෝජනා ක්‍රමය (ප්‍රතිපාදන ලබා දී ඇත. තවම වැඩ ආරම්භ කර නොමැත.) | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය. කෘෂිකර්ම හා පශුසම්පත් අමාත්‍යාංශය සමෘද්ධි සංවර්ධන භාරකාර අරමුදල. |
| 1v. | සියඹලෑව සිට කුඹුක්කඩවල දක්වා දිවෙන මාර්ගය ප්‍රතිසංස්කරණය (නව පාලම හරහා) | සමෘද්ධි සංවර්ධන අරමුදල මගින් 2004 වසරේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගො.ප.පු.ආයතනයට ලබාදුන් මුදලින්. |

## 6. සංවිධාන, කුඩා කණ්ඩායම් ඇති කිරීම, ශක්තිමත් කිරීම.

| | | |
|---|---|---|
| 1. | පහළ සියඹලෑව ගොවි කාන්තාවන් සඳහා කාන්තා සංගමයක් ආරම්භ කිරීම | කලාප කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය,මහව. |

11. පහළ සියඹලාව ගොවි සංවිධානය
ශක්තිමත් කිරීම සඳහා
දැනුවත් භාවය ලබා දීම. ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

111. පොතානේගම ගොවිසංවිධානය
ශක්තිමත් කිරීම සඳහා
දැනුවත්භාවය ලබාදීම ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

## 8. ශ්‍රමදාන හා වෙනත් කණ්ඩායම් කටයුතු

සියඹලාගමුව ඔය හරහා ඉදිකරනු ලබන
තැලවිල්ල සඳහා
අවශ්‍ය ශ්‍රමය ශ්‍රමදාන
මට්ටමින් ලබා ගැනීම ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය

## 4. ව්‍යාපෘතියෙහි බලපෑම් සහ අරමුණු සඵල කර ගැනීම.

4.1

| 1.පුහුණු පාඨමාලාව/නම | ප්‍රයෝජනය ලැබූ සංඛ්‍යාව |
|---|---|
| 1) ඒකාබද්ධ පලිබෝධ නාශක වැඩසටහන (සතිපතා 2003 යල කන්නය තුළ)- සියඹලාව | 12 |
| 2) ගෙවතු සංවර්ධනය පිළිබඳ පුහුණුව (සියඹලාව) | 12 |
| 3) කොම්පෝස්ට් සෑදීම පිළිබඳ පුහුණුව (සියඹලාව) | 16 |
| 4) ක්ෂේත්‍ර චාරිකාව (පොතානේගම සහ සියඹලාව) | 16 |
| 5) පාංශු සංරක්ෂණය පිළිබඳ පුහුණුව (පොතානේගම) | 28 |
| 6) ගොවි කාන්තාවන් සඳහා ආහාර සකස් කිරීම පිළිබඳ පුහුණුව | 16 |
| 7) පාංශු සංරක්ෂණය පිළිබඳ පුහුණුව (සියඹලාව) | 12 |

2. වගාවන් හා වෙනත් කටයුතු පිළිබඳ ආදර්ශන.

| | |
|---|---|
| බිත්තර වී ආදර්ශන - සියඹලාව | 02 |

| 3. බීජ/පැල ලබාදීම (ලබාදුන් ද්‍රව්‍යය) | එක් අයෙකුට | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|
| ගෙවතුවල සිටුවීම සඳහා තේක්ක පැල 4000 ක් ලබා දීම | 20 | 200 |
| කෝපි පැල 400 ක් ලබාදීම | 02 | 200 |

| | | |
|---|---|---|
| ගම්මිරිස් පැළ 600 ක් ලබා දීම | 03 | 200 |

4 වැව්/අමුණු/පාරවල් ප්‍රතිසංස්කරණයන්

| කටයුත්ත | ප්‍රතිලාභීන් |
|---|---|
| 1. පොතානේගම සිට සියඹලෑව දක්වා දිවෙන මාර්ගය පුළුල් කිරීම | පහළ සියඹලෑව හා පොතානේගම ගම්වාසීන් |
| 11මාර්ගය ප්‍රතිසංස්කරණය . සියඹලෑව සිට කුඹුක්කඩවල දක්වා දිවෙන | ගම්වාසීන් පහළ සියඹලෑව සහ පොතානේගම |

5 අළුතෙන් කළ ඉදිකිරීම්

| ඉදිකිරීම | ප්‍රතිලාභීන් | නිෂ්පාදනයට/ඵලදායීතාවයට බලපෑම |
|---|---|---|
| 1) සියඹලාංගමුව ඔය හරහා තැලවිල්ල ඉදිකිරීම | පොතානේගම හා සියඹලෑව ගම්වාසීන් | කෘෂි නිෂ්පාදන නගරයට ගෙනයාමට තිබූ දුෂ්කරතා මගහැරී යාම. මොරගොල්ලාගම හා කුරුණෑගල නගර කරා යාමට තිබූ අපහසුතාවයන් මග හැරීම. |

6 සංවිධාන/සමිති සමාගම් ගොඩනැගීම, ශක්තිමත් කිරීම.

| ස්වභාවය | ඒ නිසා ඇති වූ ප්‍රතිලාභය |
|---|---|
| 1) සියඹලෑව කාන්තා සංගමය | කාන්තාවන් එක්රැස් වීම නිසා ගෙවතු වගාවන් පිළිබඳ දැනුම ලබාගත හැකිවීම, කොම්පෝස්ට් සෑදීම පිළිබඳ දැනුම ලබාගත හැකිවීම. |
| 2) පහළ සියඹලෑව ගොවි සංවිධානය | තැලවිල්ල ඉදිකිරීම සඳහා අවශ්‍ය ශ්‍රමය සම්පූර්ණයෙන්ම ලබාගත හැකි වීම. |
| 3) පොතානේගම ගොවි සංවිධානය | ප්‍රජා ශාලාව ඉදිකිරීම සඳහා අවශ්‍ය ශ්‍රමය ලබාදීමට කටයුතු සම්පාදනය කරමින් පවතී. |

# 5 පරිච්ඡේදය

මහපොතානේගම තිරසර සංවර්ධන ව්‍යාපෘතියේ අත්දැකීම් මගින් තහවුරු කරගනු ලැබූ ප්‍රධාන ඉගෙනුම් කිහිපයකි.

1. සංවර්ධන කටයුතුවලදී මුහුණදීමට සිදුවන සමාජ - ආර්ථික විරෝධතාවන් උපක්‍රමික ව ජයගත හැකි බව.

අදාල ව්‍යාපෘතියේ දී හෙ. කො.ගො.ප.පු.ආයතනයේ පර්යේෂකයන් සෘජු ලෙස ම ගැමියන් හා එක් ව කටයුතු කරනු දැකීම මුල් අවස්ථාවලදී ඇතැම් දේශපාලන කණ්ඩායම් හා ගැමි ප්‍රභූන් ශුභවාදීව දුටුවේ නැත. මේ නිසා පර්යේෂකයෝ ඔවුන් සංවර්ධන ප්‍රවේශය සඳහා උපක්‍රමශීලීව නතු කර ගැනීම සඳහා උපාය මාර්ග කිපයක් යෙදුවෝ ය.

අ. එකී දේශපාලන කණ්ඩායම් හා ගැමි ප්‍රභූන් සමග පර්යේෂකයන් ලෙන්ගතුව කටයුතු කිරීම.

ආ. ඔවුන්ගේ ප්‍රධානත්වය හා නායකත්වය අදාල සංවර්ධන ව්‍යාපෘතිය මගින් තව තවත් තහවුරු වන බව පෙන්වා දීම හා ඒ අනුව කටයුතු කිරීම.

ඇ. ගැමි ප්‍රභූන් හා ප්‍රාදේශීය දේශපාලන නායකයන් ව්‍යාපෘති මට්ටමින් පැවැත්වෙන රැස්වීම් හා සාකච්ඡා සඳහා ගෙන්වා ගනිමින් ඔවුන් අපේක්ෂා කරනු ලබන නායකත්වය පිළිගැනීම සහතික කර දීම.

2.රාජ්‍ය නිලධාරි තන්ත්‍රයෙන් මතු වන බාධක ඉතා පහසුවෙන් ජය ගත හැකි බව.

දේශපාලන හා අනෙකුත් ගැමි ප්‍රභූන් මෙන් ම රාජ්‍ය නිලධාරි තන්ත්‍රයෙන් ද සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භක අවස්ථාවේ දී දක්නට ලැබුණේ තරමක උදාසීන සහයෝගයකි. මේ තත්ත්වය ජය ගැනීම සඳහා උපයෝගී කර ගත් උපාය මාර්ග පහත ආකරය.

අ. තිරසර සංවර්ධන ව්‍යාපෘතිය ගො.ක. ආයතනයේ ව්‍යාපෘතියක් වශයෙන් නො ව ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරින්ගේ ම ව්‍යාපෘතියක් බවට පත් කිරීම.

ආ. සෑම ව්‍යාපෘති රැස්වීම් අවස්ථාවක ම රාජ්‍ය නිලධාරි මහතුන් ඉතා ඉහළින් අගය කිරීම හා ව්‍යාපෘතියේ සාර්ථකත්වය පිළිබඳ පූර්ණ ගෞරවය ඔවුන් වෙතට ම ලබා දීම.

ඇ. සාර්ථකව ව්‍යාපෘතිය ක්‍රියාවට නැගීම නිසා රාජ්‍ය නිලධාරින්ට ලැබෙන සමාජ ආර්ථික ප්‍රතිලාභ පිළිබඳව පෙන්වා දීම ( උදා. කෘෂි අමාත්‍යාංශයෙන් ණය පදනමක් මත කෘ.ප.නි. වරුන්ට යතුරුපැදි ලබාදීමේ දී ව්‍යාපෘති බල ප්‍රදේශයේ නිලධාරින්ට ප්‍රමුඛත්වය ලබා දීම.)

ඇ. තෝරාගත් නිලධාරි කොටස් හෙ.කො.ගො. ආයතනයට ගෙන්වා ගරු අමාත්‍යතුමා මගින් ව්‍යාපෘතිය පිළිබඳ ව කරුණු පැහැදිලි කර දීම.

3. වැඩි සමාජ ආර්ථික පීඩනයක් ඇති ජන කොටස් අඩු සමාජ ආර්ථික පීඩනයක් ඇති ජන කොටස්වලට වඩා ඉක්මණින් සාමූහික සංවර්ධන කටයුතු සඳහා යොදවා ගත හැකි බව.

පොතානේගම ව්‍යාපෘති බල ප්‍රදේශය ගම්මාන දෙකකින් යුතු ය. එකක් පොතානේගම වන අතර අනෙක පහළ සියඹලැව යි. පොතානේගමට සාපේක්ෂව පහළ සියඹලැව ජනතාව සාම්ප්‍රදායික ය. දිළිඳු ය. ගම් ප්‍රදේශයට පිටතින් පැමිණිය වුන් නිසා අනෙකුත් ගැමියන්ගෙන් කොන්වීමක් ද දක්නට තිබේ. මේ නිසා ඔව්හු පීඩිත ජන කොටසක් බවට පත් ව තිබේ. මෙකී පීඩනය පහළ සියඹලැව ගම්මානයේ දක්නට තිබෙන ව්‍යාපෘති සාර්ථකත්වයට ප්‍රබල හේතුවකි. ඔවුහු සියල්ලෝම ව්‍යාපෘති රැස්වීම්වලට එති. සියල්ලෝම පොදු කාර්යයන් හි යෙදෙති. රැස්වීම්වලදී යම් තීරණයක් ගනු ලබයි ද එකී තීරණ මුළුමනින් කිසිදු පැකිලීමකින් තොර ව ඉටු කරති. පහළ සියඹලැවට සාපේක්ෂව ආර්ථික අතින් ද, යටිතල පහසුකම් අතින් ද, සමාජ පිළිගැනීමෙන් ද ඉදිරියෙන් සිටින පොතානේගම ප්‍රදේශයේ ජනතාව ව්‍යාපෘති කටයුතුවලදී මන්දගාමී ය. යම් නො සැලකිල්ලක් ද ප්‍රදර්ශනය කරයි. ගම තුළ ප්‍රබල දේශපාලන බෙදීමක් ද, ග්‍රාමීය නායකත්වය හේතු කොට ගෙන ඇති වී තිබෙන බෙදීමක් ද පැහැදිලි ව දක්නට තිබේ. ඔවුහු රැස්වීම්වලදී ප්‍රසිද්ධියේ ඔවුනොවුන් සමග අරගලවලට එළඹෙති. රාජ්‍ය නිලධාරින්ට අවනත වන්නේ මඳ වශයෙනි. ගැමියන් තුලින් යම් අවිනීත බවක් ද ප්‍රදර්ශනය වේ. පොතානේගම ජනතාවත්, සියඹලැවේ ජනතාවත් අතර පවතින මේ චර්යාත්මක වෙනසට එක් ප්‍රබල හේතුවක් වී ඇත්තේ ඔවුනොවුන්ගේ පීඩන මට්ටම යි. වෙනත් හේතූන් ද නැතිවා නො වේ. කෙසේ වෙතත් ප්‍රශ්නවලින් වැඩි පීඩනයකට ලක් වූ ජන කොටස් සංවර්ධනයට යොමු කිරීමට වඩා ප්‍රශ්නවලින් අඩු පීඩනයකට ලක් වූ අය සංවර්ධනයට යොමු කිරීම අපහසු බව මෙම අභ්‍යාසයේ දී පැහැදිලි විය.

4. කාන්දු ඵලය (Spill - over effect)

සාර්ථකත්වයේ බලපෑම අසාර්ථක තත්ත්වයන් ජය ගැනීමට පාදක වන බව මෙම ක්ෂේත්‍ර අභ්‍යාසයෙන් උගත් තවත් වැදගත් පාඩමකි. පහළ සියඹලෑව ගැමියන් ව්‍යාපෘති කටයුතු සඳහා පෙන්වන ලද බලවත් උනන්දුව ගො.ක. ආයතනයේ නිලධාරීන් මෙන් ම ප්‍රදේශයේ අනෙකුත් රාජ්‍ය නිලධාරීන් ද ඔවුන් වෙත ඇඳ බැඳ තබා ගැනීමට සමත් විය. මක් නිසාද? ඔව්හු සම්මුතියට පැමිණෙන ලද ඕනෑම ව්‍යාපෘති කටයුත්තක් නොවලහා ඉටු කරන ලද නිසා ය. ඔව්හු සියළු දෙනාම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මග පෙන්වීම යටතේ වල ක්‍රමයටත්, ගොඩ ක්‍රමයටත් කොම්පෝස්ට් නිෂ්පාදනය කළ නිසා ය. ඔව්හු සියළුදෙනාම දෙන ලද උපදෙස් මත පිහිටා කාබනික ගෙවත්තක් නිර්මාණය කළ නිසා ය. සියළුදෙනාම වී වගාව සඳහා පිදුරු භාවිතයට පෙළඹුනු නිසා ය. රැස්වීම්වලට නිසි පරිදි පැමිණුනා මෙන් ම සංවර්ධන කටයුතු වලදී අපේක්ෂිත මට්ටමකට වඩා ශ්‍රම දායකත්වයක් ලබා දුන් නිසා ය. එබැවින් මාස තුනක් ගත වීමට මත්තෙන් සියඹලන් ඔය හරහා සමෘද්ධි ආධාර මත පාලමක් ඉදි කිරීමට පහළ සියඹලෑව ගැමියන්ට හැකි විය. එපමණක් නොව ගැමියන් තුල පැවති දැඩි කැපවීම හා උනන්දුව නිසා ගමට විදුලිබලය ලබා දීම සඳහා ප්‍රතිපාදන ලබා දීමට ද රාජ්‍ය නිලධාරීහු පෙළඹුනහ.

මන්දගාමී ව සිටි පොතානේගම වැසියන් සියඹලෑවේ සිදු වූ සීඝ්‍ර පරිවර්තනය දෙස බලා යම් පාඩමක් උගත් බව මෙම ක්ෂේත්‍ර අභ්‍යාසයේ දී පැහැදිලිව පෙනුනි. පහළ සියඹලෑවේ පරිවර්තනය සමග පොතානේගම වැසියන්ගේ නිබඳ කතිකාවට පත් වූයේ මාස කිපයක් තුළ පහළ සියඹලෑව ගම්මානය තුළ ඇති වූ පරිවර්තනයේ රහස පිළිබඳව යි. ඇතැම් ගැමියෝ ඒ පිළිබඳ ව සාධු ලෙස ම ඊර්ෂ්‍යා කළහ. මේ නිසා පහළ සියඹලෑව පාලමේ ඉදිකිරීම් කටයුතු සඳහා ශ්‍රම දායකත්වය ලබාදීමට පොතානේගමින් කිසිවකු ඉදිරිපත් වූයේ ද නැත. කෙසේ වුව ද, පොතානේගම ගැමියන්ගෙන් කිප දෙනෙකු පහළ සියඹලෑවේ පරිවර්තනයේ පදනම ගැමියන් තුල පැවති සාමූහිකත්වය හා කැපවීම බවත්, ඒ මගින් පොතානේගමට යම් පාඩමක් උගත හැකි බවත් තේරුම් ගත් බැවින් 2003 වසරේ අග භාගය වන විට පොතානේගම වැසියන් තුළ ද තරඟකාර සංවර්ධන පදනමක් ඇති වූයේ ය. ඔව්හු පොතානේගමට අත්‍යාවශ්‍ය ව තිබෙන ප්‍රජා ශාලාවක් ඉදි කිරීමට තීන්දු කළ හ. පහළ සියඹලෑවේ පාලම ඉදිකිරීම සඳහා සමෘද්ධි මුදල් ආධාර ලැබුණු නමුත් පොතානේගම ප්‍රජා ශාලාව සඳහා මුදල් ලැබීමේ කිසිදු බලාපොරොත්තුවක් තිබුනේ නැත. එහෙත් පොතානේගම වැසියන් තමන් විසින් ම තමන්ගේ සංවර්ධනය සඳහා ආරම්භයක් ලබා දිය යුතු ය යන තිර අදිටනකින් යුතුව අදාල සංවර්ධන කටයුත්තට ප්‍රවිෂ්ඨ වූහ. ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් වරයා විසින් ලබා දුන් රජයේ ඉඩම් කොටසක ස්වෝත්සාහයෙන් ම අත්තිවාරම් කැපූ පොතානේගම වැසියෝ මේ වන විට වැලි, කළුගල් හා අනෙකුත් උපකරණ තම වියදමින් හා ශ්‍රමයෙන් උපයා ගනිමින් සිටී. මුදල් ඇති බව දන්නා පදනමක් යටතේ සියඹලෑවේ වැසියන් ඉදි කිරීමට ඉදිරිපත් වූ පාලමටත් වඩා මුදල් නොමැති පදනමක් මත පොතානේගම වැසියන් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට ඉදිරිපත් වීම ප්‍රබල පරිවර්තනයකි. මේ වන විට පොතානේගම ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ඉදිවෙමින් තිබේ. එකදු සතයක් වත් මෙතෙක් රජයෙන් හෝ වෙනත් ආයතනයකින් ලැබී නැත. ඔවුනට තනි ව කළ නොහැකි මෙම ඉදි කිරීම නිම කර ගැනීම



LIBRARY
PARTI

සඳහා යම් දායකත්වයක් ලබා දීමට දැන් ව්‍යාපෘති මෙහෙයවන්නන් කටයුතු කරමින් සිටී. පොතානේගම ජනතාව තුළ සිදු වූ පරිවර්තනය සැබැවින් ම සියඹලෑව ගම්මානයේ සංවර්ධනයෙන් ඇති වූ බලපෑම මත පදනම් වූ තත්ත්වයක් බව නම් ඉතා පැහැදිලි ය.

5. සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධනය සඳහා ක්ෂේත්‍ර නිලධාරි සම්බන්ධතාවේ වැදගත්කම.

මෙම සංවර්ධන උත්සාහයේ දී උගත් තවත් වැදගත් පාඩමක් නම් සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයක දී රාජ්‍ය අංශයේ ක්ෂේත්‍ර නිලධාරීන්ට කළ හැකි කාර්යභාරය කොතෙක් ද යන්න යි. ඕනෑම ග්‍රාම සේවා වසම් මට්ටමක දී දක්නට ලැබෙන ක්ෂේත්‍ර මට්ටමේ රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකි. ග්‍රාම නිලධාරි, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර හා සමෘද්ධි සංවරධන නිලධාරි යන නිලධාරීහු මේ නිලධාරීන් වෙති. ඉතා පැහැදිලිව ම ප්‍රදර්ශනය වූ තත්ත්වය නම් මෙකී නිලධාරීන් තිදෙනා කැපවීමෙනුත්, අවංකවත් ග්‍රාමීය සංවර්ධන කටයුතු මෙහෙය වනවා නම් සෑම ග්‍රාම සේවා වසමක් ම අද තිබෙන තත්ත්වයට වඩා සැලකිය යුතු ඉහළ සංවර්ධන මට්ටමකට ළඟා කර ගත හැකි බව යි. මක් නිසා ද? මොවුන් තිදෙනා ගමේ සමාජ ආර්ථික තත්ත්වයේ අස්සක් මුල්ලක් නෑර සියල්ල ඉතා හොඳින් දන්නා නිසා ය. මොවුහු සැබෑ දිළින්දා හඳුනති. සැබෑ පොහොසතා හඳුනති. සැබෑ වංචනිකයා හඳුනති. සහභාගිවන්නා, සහභාගි නො වන්නා, අලසයා, උත්සාහ වන්තයා, උගතා, නූගතා වෙන් වෙන් වශයෙන් දනිති. එමෙන්ම ඔවුහු ගැමියන්ගේ සැබෑ ඕනෑ එපාකම් දන්නා නිලධාරීහු ද වන්නේ ය. ගමේ සම්පත් පදනම පිළිබඳ මනා අවබෝධයක් තිබෙන නිලධාරීහු ද වන්නේ ය. මේ නිසා සංවර්ධනය සඳහා ගම තුළ ඇති කළ යුතු පරිවර්තනයකට පුරෝගාමී කටයුත්තක් ඔවුනට කළ හැකි ය.

සියඹලෑව හා පොතානේගම තිරසර සංවර්ධන වැඩසටහනේ නියමුවන් බවට පත් වූයේ මෙකී ක්ෂේත්‍ර නිලධාරීහු ය. සැබෑ වුවමනාවක් තිබේ නම් කිසිදු බාහිර උත්ප්‍රේරකයෙකු නො මැතිව සියල්ල නිසි පරිදි ඉටු කිරීමට ක්ෂේත්‍ර නිලධාරීන් සමත් බව මෙම ක්ෂේත්‍ර අභ්‍යාසයේ දී මනා ව පැහැදිලි විය. අවශ්‍ය වන්නේ හුදෙක් පෙළඹවීමක්, දිරිගැන්වීමක්, අගය කිරීමක් පමණි. ඕනෑම මිනිසකු තුළ තිබෙන පෙළඹවීමකට හසුවීමේ විභවතාව (Potentiallity) මොවුන් තුළ ද එසේම පවතින බව තේරුම් ගත හොත් නිසි පරිදි ක්ෂේත්‍ර නිලධාරීන් හසුරුවා ග්‍රාම සංවර්ධනය වඩා ඉක්මන් කර ගත හැකි බව මෙම ක්ෂේත්‍ර අභ්‍යාසයෙන් උගත හැකි විය.

6. බාහිරයන් බාහිරව සිටීම හා තිරය පිටුපස සිටීම

ග්‍රාමීය සංවර්ධන අභ්‍යාසයන් ගැමියන්ගේ හා අදාල ප්‍රදේශවල නිලධාරීන්ගේ ම අභ්‍යාසයක් වන තරමට ඒවායේ සාර්ථකත්වය හා කල් පැවැත්ම ද වැඩි ය. බාහිර ව පැමිණෙන අය විසින් ව්‍යාපෘතිවල භාරකාරත්වය ගැනීම හෝ ව්‍යාපෘතිය වෙනුවෙන් පෙනී සිටීම හෝ එහි කටයුතුවල ගෞරවය වෙනුවෙන් ඉල්ලුම්පත්‍ර දැමීම හෝ කිසියේත් නො කළ යුතු බව මේ ක්ෂේත්‍ර අභ්‍යාසයෙන් උගත් තවත් වැදගත් පාඩමකි. පොතානේගම ව්‍යාපෘතිය අදට ක්‍රියාත්මක තත්ත්වය යටතේ කිසි විටෙකත් ගො.ප.ආ. ව්‍යාපෘතියක් ලෙස ගැමියන් විසින් හෝ නිලධාරීන් විසින් හඳුන්වන්නේ නැත. ඔවුන් හැම විටම එය හඳුන්වන්නේ ඔවුන්ගේ ව්‍යාපෘතියක් ලෙස යි. ව්‍යාපෘතිය බාහිර අයගේ බව පෙනෙන තරමට පරායත්තතාව වැඩි ය. උනන්දුව අඩු ය. වගකීම අඩු ය. තමන්ගේ ම බව පෙනෙන විට හා දැනෙන විට පරායත්තතාවක් නැත. උනන්දුව වැඩි ය. වගකීම වැඩි ය.

7. අධිකාරිමය බලය හා පෙළඹුම.

පොතානේගම තිරසර සංවර්ධන ව්‍යාපෘතියේ සාර්ථකත්වයට තුඩු දුන් එක් අදෘශ්‍යමාන සාධකයක් නම් ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ ප්‍රවිශ්ඨය හා එම ප්‍රවිශ්ඨය සිදු වූ ස්වභාවය යි. කෘෂිකර්ම අමාත්‍යවරයා පොතානේගම ප්‍රථම ව්‍යාපෘති රැස්වීමේදී ම පෙනී සිටි බැවින් අදාල සංවර්ධන වැඩසටහනට නව ජවයක් ලැබුනු බව පර්යේෂකයන්ගේ තේරුම් ගැනීමයි.

ඇමති වරයෙකුට දේශපාලන පදනමක් ඇති නිසා මෙවැනි ප්‍රවිශ්ඨයක් සහභාගිත්ව සංවර්ධන ව්‍යාපෘතියකට නිෂේධනාත්මක ව ද බලපෑ හැකි නමුත් ඇමති තුමාගේ ප්‍රවිශ්ඨය මෙම සංවර්ධන ව්‍යාපෘතියේ දී බලපෑවේ සාධනාත්මක ආකාරයෙනි. මක් නිසා ද? එතුමාගේ ප්‍රවේශය අතිශයින් ස්වාධීන ප්‍රවේශයක් ලෙස සිදු වූ බැවිනි. සියළු ගැමියන් හා නිලධාරීන් එක් රැස් වූ ආරම්භක ව්‍යාපෘති රැස්වීමේ දී එතුමා සඳහන් කලේ කිසිදු දේශපාලන පදනමකින් තොර ව අදාල සංවර්ධන ක්‍රියාදාමය දියත් කරන බවත්, එතුමාගේ පූර්ණ සහාය පක්ෂ භේදයකින් තොර ව සියළු දෙනාටම ලබා දෙන බවත් නැවත එතුමා පැමිණෙන විට ගම්මානය සැබැවින් ම තිරසර ගම්මානයක් බවට පත්ව තිබෙනු දැකීමට මනාප බවත් ය. එබැවින් කෘෂිකර්ම අමාත්‍යතුමාගේ ප්‍රවිෂ්ඨයත්, ප්‍රවිෂ්ඨයේ ස්වභාවයත් පොතානේගම ක්ෂේත්‍ර අභ්‍යාසයේ සාර්ථකත්වයට මහත් සේ දායක වී ඇති බව කිව යුතු ය. විශේෂයෙන් රාජ්‍ය නිලධාරීන්ගේ නො මඳ අනුග්‍රහය ව්‍යාපෘතියට ලැබීමේ එක් රහසක් මේ ප්‍රවිෂ්ඨය බව පර්යේෂකයන්ගේ අවබෝධය යි.

# 6 වෙනි පරිච්ඡේදය

නිගමන හා යෝජනා

- ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන් සාර්ථක කරගැනීමේදී ප්‍රජා සහභාගිත්වය නිසි අයුරින් ලබා ගැනීම සාර්ථක ක්‍රමෝපායක් බව මෙම ව්‍යාපෘතිය තුළින් මනාව දක්නට ලැබූ දෙයකි. මෙහිදී මෙවැනි සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබඳව සුභවාදී ආකල්පයක් නොමැති ජන කොටස්වල සහයෝගය ලබා ගැනීම ද ඉතා වැදගත් වන්නකි. ඒ සඳහා ඔවුන් උපක්‍රමශීලීව නම්මවා ගැනීම මෙවැනි ග්‍රාමීය සංවර්ධන වැඩසටහන්වල සාර්ථකත්වයට වැදගත් වේ.

- විවිධ වූ ග්‍රාමීය අවශ්‍යතාවයන් ඉලක්ක කරගෙන සංවර්ධන කාර්යයන් ආරම්භ කිරීම බහුතර ජනකොටස්වල ක්‍රියාකාරී සහභාගිත්වය ලබාගැනීමට පිටිවහලක් වෙයි. මෙවැනි ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ දී සැලසුම් සකස් කිරීමේ දී එවන් ක්‍රියාත්මක අවධිය දක්වා එය ඔවුනගේ වැඩසටහන් ලෙසට ක්‍රියාත්මක කිරීම තුළින් ව්‍යාපෘතිය කෙරෙහි ඔවුන්ගේ විශ්වාසය දිනා ගැනීමත් සාර්ථකව කළ හැකි වන බව මෙම ව්‍යාපෘතිය තුළින් පැහැදිලි විය.

- පොතානේගම ගම්මානය 100% ක්ම පාහේ කෘෂිකාර්මික දිවි පෙවෙතක් ගත කරන ගොවීන්ගෙන් සමන්විත ගම්මානයකි. එමනිසා කෘෂිකාර්මික සංවර්ධනය ඉලක්ක කරගත් වැඩසටහන් හඳුන්වා දීම තිරසර සංවර්ධනයක් සඳහා පිටිවහලක් වන්නකි. වැඩසටහන ආරම්භයේ සිටම කෘෂි සංවර්ධනය ඉලක්ක කරගත් අධ්‍යාපනික, මෙන්ම ක්ෂේත්‍ර වැඩසටහන් රාශියක් දියත් කරන ලද අතර ඒවායේ යහපත් ප්‍රතිඵල අද දක්නට ඇත. ඉදිරියේ දී ද මෙවැනි වැඩ සටහන් හඳුනාගෙන කෘෂි ආර්ථිකයේ සංවර්ධනයක් ඇති කිරීම වැදගත් ය.

- පොතානේගම ව්‍යාපෘති බල ප්‍රදේශයේ ස්වයං රැකියාවල නියුක්ත වීම දක්නට ලැබුණේ ඉතා සුලු වශයෙනි. රැකියා විරහිත තරුණ තරුණියන් ඉලක්ක කරගත් වැඩ සටහන් ඇති කිරීම ද මෙම ව්‍යාපෘතිය මගින් කරන ලද තවත් සංවර්ධන කාර්යයක් ලෙස පෙන්වා දිය හැක. ඒ සඳහා තරුණ තරුණියන්ට පුහුණුව හා අවශ්‍ය සහාය ලබා දීම තුළින් විවිධ ස්වයං රැකියා ක්ෂේත්‍රවලට යොමු කිරීමට හැකිවනු ඇත.

ඇමුණුම

# තිරසර සංවර්ධන ගම්මාන වැඩසටහන

## පොතානේගම

*වගු අංක 01*

### පවුලේ සාමාජික සංඛ්‍යාව

ගම - පහලසියඹලැව

| සාමාජික සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | පිරිමි | ගැහැණු |
|---|---|---|---|
| 1 - 2 | 5 | 4 | 4 |
| 3 - 4 | 17 | 30 | 30 |
| >= 5 | 7 | 18 | 19 |
| එකතුව | 29 | 52 | 53 |

*වගු අංක 01 (a)*

### පවුලේ සාමාජික සංඛ්‍යාව

ගම - පොතානේගම

| සාමාජික සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | පිරිමි | ගැහැණු |
|---|---|---|---|
| 1 - 2 | 19 | 17 | 16 |
| 3 - 4 | 68 | 124 | 126 |
| >= 5 | 65 | 188 | 192 |
| එකතුව | 152 | 329 | 334 |

*වගු අංක 02*

### පාසල් යන ළමුන්

| | පහලසියඹලැව | පොතානේගම | එකතුව |
|---|---|---|---|
| පිරිමි | 12 | 89 | 101 |
| ගැහැණු | 9 | 89 | 98 |

*වගු අංක 03*

## සේවා නියුක්තිය

| | පහලසියඹලෑව | | පොතානේගම | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| ගොවින් | 44 | 69.8 | 209 | 60.7 |
| කම්කරු රැකියා | 9 | 14.3 | 72 | 20.9 |
| වැටුප් ලබන රැකියා | 10 | 15.8 | 63 | 18.3 |
| විදේශ රැකියා | 0 | 0 | 0 | 0 |
| ස්වයං රැකියා | 0 | 0 | 0 | 0 |
| එකතුව | **63** | **100.0** | **344** | **100.0** |

*වගු අංක 04*

## සමෘද්ධි ප්‍රතිලාභී පවුල් ගණන

| | පහලසියඹලෑව | % | පොතානේගම | % | එකතුව | % |
|---|---|---|---|---|---|---|
| ඔව් | 17 | 58.6 | 106 | 69.7 | 123 | 67.9 |
| නැත | 12 | 41.4 | 46 | 30.3 | 58 | 32.1 |

*වගු අංක 05*

## පවුලේ ප්‍රධාන ආදායම් මාර්ගයන්

ගම - පහලසියඹලෑව

| මාර්ගයන් | ප්‍රධාන | % | ද්විතියික | % |
|---|---|---|---|---|
| කෘෂිකර්මය | 27 | 93.1 | 2 | 20.0 |
| සත්ත්ව පාලනය | 0 | 0.0 | 5 | 50.0 |
| කෘෂි කම්කරු | 0 | 0.0 | 1 | 10.0 |
| රජයේ/ පුද්ගලික රැකියා | 1 | 3.6 | 2 | 20.0 |
| කම්කරු රැකියා | 1 | 3.6 | 0 | 0.0 |
| එකතුව | **29** | 100.0 | **10** | **100.0** |

*වගු අංක 05 (a)*

## පවුලේ ආදායම් මාර්ගයන්

ගම - පොතානේගම

| මාර්ගයන් | ප්‍රධාන | % | ද්විතියික | % |
|---|---|---|---|---|
| කෘෂිකර්මය | 124 | 81.6 | 12 | 17.1 |
| සත්ත්ව පාලනය | 1 | 0.7 | 13 | 18.6 |
| කෘෂි නොවන කම්කරු | 4 | 2.8 | 3 | 4.3 |
| කෘෂිකාර්මික කම්කරු | 6 | 4.2 | 19 | 27.1 |
| ස්වයං රැකියා | 1 | 0.7 | 4 | 5.7 |
| රජයේ/ පෞද්ගලික රැකියා | 14 | 9.7 | 14 | 20.0 |
| කම්කරු රැකියාවන් | 0 | 0.0 | 2 | 2.9 |
| වෙළදාම | 1 | 0.7 | 1 | 1.4 |
| දරුවන්ගෙන් යැපීම් | 1 | 0.7 | 0 | 0.0 |
| විදේශ රැකියා | 0 | 0.0 | 1 | 1.4 |
| වෙනත් | 0 | 0.0 | 1 | 1.4 |
| එකතුව | **152** | **100.0** | **70** | **100.0** |

*වගු අංක 06*

## නිවාස අයිතිය

ගම - පහලසියඹලැව

| අයිතිය | සංඛ්‍යාව | % |
|---|---|---|
| තමාට අයිති | 26 | 89.7 |
| කුලියට ගත් | 2 | 6.9 |
| වෙනත් | 1 | 3.4 |
| එකතුව | **29** | **100.00** |

*වගු අංක 06 (a)*

## නිවාස අයිතිය

පොතානේගම ගම

| අයිතිය | සංඛ්‍යාව | % |
|---|---|---|
| තමාට අයිති | 137 | 90.1 |
| වෙනත් | 14 | 9.2 |
| වාර්තා නොකල | 1 | 0.7 |
| එකතුව | **152** | **100.00** |

*වගු අංක 07*

## පදිංචි ඉඩමේ අයිතිය

ගම - පහලසියඹලෑව

| අයිතිය | සංඛ්‍යාව | % |
|---|---|---|
| අයිති | 24 | 82.8 |
| රජයේ ඉඩම් | 1 | 3.4 |
| දෙමව්පියන්ට අයත් | 3 | 10.3 |
| වෙනත් | 1 | 3.4 |
| එකතුව | **29** | **100.0** |

*වගු අංක 07 (a)*

## පදිංචි ඉඩමේ අයිතිය

ගම - පොතානේගම

| අයිතිය | සංඛ්‍යාව | % |
|---|---|---|
| තමාට අයත් | 119 | 78.3 |
| රජයේ | 14 | 9.2 |
| දෙමව්පියන්ට අයත් | 8 | 5.3 |
| සහෝදරයන්ට අයත් | 1 | 0.7 |
| පොදු | 1 | 0.7 |
| ඥාතින්ට අයත් | 1 | 0.7 |
| වෙනත් | 8 | 5.3 |
| එකතුව | **152** | **100.0** |

*වගු අංක 08*

## නිවසේ තත්වය - බිත්ති

ගම - පහලසියඹලෑව

| වර්ගය | සංඛ්‍යාව | % |
|---|---|---|
| ගඩොල් | 9 | 31.0 |
| මැටි | 20 | 69.0 |
| එකතුව | **29** | **100.0** |

*වගු අංක 08 (a)*

## නිවසේ තත්වය - බිත්ති

ගම - පොතානේගම

| වර්ගය | සංඛ්‍යාව | % |
|---|---|---|
| ගඩොල් | 102 | 67.1 |
| වරිච්චි | 20 | 13.1 |
| මැටි | 28 | 18.4 |
| සිමෙන්ති ගඩොල් | 2 | 1.3 |
| එකතුව | **152** | **99.9** |

*වගු අංක 09*

## නිවසේ තත්වය -වහලය

ගම - පහලසියඹලෑව

| වර්ගය | සංඛ්‍යාව | % |
|---|---|---|
| උළු | 10 | 34.5 |
| පොල් අතු | 11 | 37.9 |
| ගැල්වනයිස් තහඩු | 8 | 27.6 |
| එකතුව | **29** | **100.0** |

*වගු අංක 09(a)*

## නිවසේ තත්වය - වහලය

ගම - පොතානේගම

| වර්ගය | සංඛ්‍යාව | % |
|---|---|---|
| උළු | 92 | 60.5 |
| පොල් අතු | 31 | 20.4 |
| ගැල්වනයිස් තහඩු | 24 | 15.7 |
| ඇස්බැස්ටෝස් | 5 | 3.3 |
| එකතුව | **152** | **100** |

*වගු අංක 10*

## නිවසේ තත්වය -පොලව

ගම - පහලසියඹලැව

| වර්ගය | සංඛ්‍යාව | % |
|---|---|---|
| සිමෙන්ති | 6 | 20.7 |
| ගොම මැටි | 23 | 79.3 |
| එකතුව | 29 | 100.0 |

*වගු අංක 10 (a)*

## නිවසේ තත්වය -පොලව

ගම - පොතානේගම

| වර්ගය | සංඛ්‍යාව | % |
|---|---|---|
| සිමෙන්ති | 50 | 32.8 |
| ගොම මැටි | 102 | 67.2 |
| එකතුව | 152 | 100.0 |

*වගු අංක 11*

## පොලවේ වර්ග ප්‍රමාණය

ගම - පහලසියඹලැව

| වර්ග අඩි | නිවාස සංඛ්‍යාව | % |
|---|---|---|
| 0 -100 | 1 | 3.4 |
| 101 - 200 | 4 | 13.8 |
| 202 - 400 | 14 | 48.3 |
| 401 - 500 | 2 | 6.9 |
| 501 - 750 | 4 | 13.8 |
| 751 - 1000 | 4 | 13.8 |
| එකතුව | **29** | **100.0** |

වගු අංක *11(a)*

## පොලවේ වර්ග ප්‍රමාණය

ගම - පොතානේගම

| වර්ග අඩි | නිවාස සංඛ්‍යාව | % |
|---|---|---|
| 0 -100 | 15 | 9.9 |
| 101 - 200 | 4 | 2.6 |
| 202 - 400 | 56 | 36.8 |
| 401 - 500 | 19 | 12.5 |
| 501 - 750 | 42 | 27.6 |
| 751 - 1000 | 7 | 4.6 |
| 1000 සිට ඉහළට | 9 | 5.9 |
| එකතුව | **152** | **100.0** |

වගු අංක *12*

## වැසිකිළි පහසුකම්

ගම - පහලසියඹලෑව

| වැසිකිළි වර්ගය | සංඛ්‍යාව | % |
|---|---|---|
| වළ වැසිකිළි | 7 | 24.1 |
| ජල මුද්‍රිත | 6 | 20.7 |
| වැසිකිළි නොමැත | 16 | 55.2 |
| එකතුව | 29 | 100.0 |

වගු අංක *12(a)*

## වැසිකිළි පහසුකම්

ගම - පොතානේගම

| වැසිකිළි වර්ගය | සංඛ්‍යාව | % |
|---|---|---|
| වළ වැසිකිළි | 25 | 16.4 |
| ජල මුද්‍රිත | 50 | 32.9 |
| වැසිකිළි නොමැත | 73 | 48.0 |
| වාර්තා නොකළ | 4 | 2.6 |
| එකතුව | 152 | 100.0 |



පුස්තකාලය
LIBRARY

*වගු අංක 13*

## නිවාස ආලෝක කිරීම

ගම - පහලයියඹලැව

| මාධ්‍යය | සංඛ්‍යාව | % |
|---|---|---|
| භූමිතෙල් | 29 | 100.00 |

*වගු අංක 13 (a)*

## නිවාස ආලෝක කිරීම

ගම - පොතානේගම

| මාධ්‍යය | සංඛ්‍යාව | % |
|---|---|---|
| විදුලි බලය | 35 | 23.0 |
| භූමිතෙල් | 117 | 77.0 |
| සූර්ය බලය | 2 | 1.3 |
| **එකතුව** | **152** | **100.0** |

*වගු අංක 14*

## ගෘහස්ථ උපකරණ හා කෘෂිකාර්මික උපකරණ වල අයිතිය

ගම - පහලයියඹලැව

| වර්ගය | නිවාස සංඛ්‍යාව | % |
|---|---|---|
| ගුවන්විදුලි යන්ත්‍ර | 12 | 41.3 |
| රූපවාහිනී යන්ත්‍ර | 5 | 17.2 |
| මහණ මැෂින් | 10 | 34.4 |
| බයිසිකල් | 22 | 75.8 |
| මෝටර් බයිසිකල් | 4 | 13.8 |
| කරත්ත | 1 | 3.4 |
| වතුර මැෂින් | 3 | 10.3 |
| කෘමිනාශක ඉසින යන්ත්‍ර | 7 | 24.1 |
| වඩුකාර්මික යන්ත්‍ර | 1 | 3.4 |

වගු අංක *14 (a)*

## ගෘහස්ථ උපකරණ හා කෘෂිකාර්මික උපකරණ වල අයිතිය

ගම - පොතානේගම

| වර්ගය | නිවාස සංඛ්‍යාව | % |
|---|---|---|
| ගුවන්විදුලි යන්ත්‍ර | 100 | 65.8 |
| රූපවාහිනි යන්ත්‍ර | 60 | 39.4 |
| මහණ මැෂින් | 39 | 25.6 |
| බයිසිකල් | 125 | 82.3 |
| මෝටර් බයිසිකල් | 23 | 15.1 |
| කරත්ත | 2 | 1.3 |
| වතුර මැෂින් | 4 | 2.6 |
| කෘමිනාශක ඉසින යන්ත්‍ර . | 2 | 1.3 |
| වඩුකාර්මික යන්ත්‍ර | 19 | 12.5 |
| ට්‍රැක්ටර් (රෝද 4) | 24 | 15.8 |
| ට්‍රැක්ටර් (රෝද 2) | 1 | 0.6 |

වගු අංක *15*

## බීම හා නෑම සඳහා ජල පහසුකම්

ගම - පහලසියඹලෑව

| ජල පහසුකම | බීම සඳහා | % | නෑම සඳහා | % |
|---|---|---|---|---|
| තමනට අයත් ළිඳ | 3 | 10.3 | - | - |
| පොදු ළිඳ | - | - | - | - |
| අසල්වැසියන්ගේ ළිඳ | 13 | 44.8 | - | - |
| වැව | - | - | 3 | 10.3 |
| ඇල | - | - | 26 | 89.6 |
| නල ළිඳ | 13 | 22.4 | - | - |
| එකතුව | **29** | **100.0** | **29** | **100.0** |

*වගු අංක 15 (ආ)*

## බීම හා නෑම සඳහා ජල පහසුකම්

ගම - පොතානේගම

| ජල පහසුකම | බීම සඳහා | % | නෑම සඳහා | % |
|---|---|---|---|---|
| තමනට අයත් ලිඳ | 17 | 11.1 | - | - |
| පොදු ලිඳ | 31 | 20.4 | - | - |
| අසල්වැසියන්ගේ ලිඳ | 53 | 34.8 | - | - |
| වැව | - | - | 140 | 92.1 |
| ඇළ | - | - | 4 | 2.7 |
| නළ ලිඳ | 51 | 33.5 | - | - |
| වාර්තා නොකළ | - | - | 8 | 5.3 |
| එකතුව | **152** | **100.0** | **152** | **100.0** |

*වගු අංක 16*

## ඉඩම් අයිතිය හා භාවිතය (කුඹුරු සහ ගොඩ ඉඩම්)

ගම - පහලසියඹලෑව

| ප්‍රමාණය (අක්කර) | පහලසියඹලෑව වැව යටතේ අයිති | | වෙනත් වැව් යටතේ අයිති | | පදිංචි ඉඩම | | වෙනත් ගොඩ ඉඩම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 0 - <= .5 | 0 | 0.0 | 0 | 0.0 | 1 | 2.2 | 0 | 0.0 |
| .5 - <= 1 | 0 | 0.0 | 0 | 0.0 | 1 | 2.2 | 0 | 0.0 |
| 1 - <= 2 | 1 | 9.1 | 0 | 0.0 | 17 | 37.8 | 3 | 13.6 |
| 2 - <= 5 | 6 | 54.5 | 3 | 60.0 | 19 | 42.2 | 7 | 31.8 |
| 5 <= | 4 | 36.4 | 2 | 40.0 | 8 | 17.8 | 12 | 54.5 |
| එකතුව | **11** | **100.0** | **5** | **100.0** | **45** | **100.0** | **22** | **100.0** |

*වගු අංක 16 (a)*

## ඉඩම් අයිතිය හා භාවිතය(කුඹුරු සහ ගොඩ ඉඩම්)

ගම - පොතානේගම

| ප්‍රමාණය (අක්කර) | පොතානේගම වැව යටතේ අයිති | | වෙනත් වැව් යටතේ අයිති | | පදිංචි ඉඩම | | වෙනත් ගොඩ ඉඩම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 0 - <= .5 | 1 | 3.7 | 0 | 0.0 | 5 | 2.5 | 0 | 0.0 |
| .5 - <= 1 | 1 | 3.7 | 0 | 0.0 | 9 | 4.5 | 0 | 0.0 |
| 1 - <= 2 | 5 | 18.5 | 1 | 2.1 | 74 | 36.8 | 9 | 9.6 |
| 2 - <= 5 | 17 | 63.0 | 23 | 47.9 | 76 | 37.8 | 51 | 54.3 |
| 5 <= | 4 | 14.8 | 24 | 50.0 | 37 | 18.4 | 34 | 36.2 |
| එකතුව | **27** | **100.0** | **48** | **100.0** | **201** | **100.0** | **94** | **100.0** |

*වගු අංක 17*

## කෘෂි ක්ෂේත්‍රයට අදාලව මුහුණපාන ගැටළු

ගම - පහලසියඹලෑව

| ප්‍රශ්න | සංඛ්‍යාව | % |
|---|---|---|
| ජල හිඟය/ වැව් ගොඩ වී තිබීම | 24 | 82.7 |
| උසස්තත්වයේ බීජ සහ පැල ලබාගත නොහැකිවීම | 11 | 37.9 |
| අලෙවිකිරීමේ ගැටළු/ හොඳ මිලක් නොමැතිකම | 5 | 17.2 |
| කෘෂිකාර්මික උපකරණ නොමැති වීම | 1 | 3.4 |
| මූල්‍ය ධනය නොමැතිවීම | 8 | 27.5 |
| මාර්ග අපහසුතා නිසා ඇතිවන ප්‍රවාහන ගැටළු | 10 | 34.4 |
| ඉඩම් හිඟය/ කුඹුරු ඉඩම් අයිතිය නොමැති වීම | 2 | 6.8 |
| සත්ත්ව හානි නිසා වගා හානි සිදුවීම | 1 | 3.4 |

*වගු අංක 17 (a)*

## කෘෂි ක්ෂේත්‍රයට අදාලව මුහුණපාන ගැටළු

ගම - පොතානේගම

| ප්‍රශ්න | සංඛ්‍යාව | % |
|---|---|---|
| ජල හිඟය/ වැව් ගොඩ වී තිබීම | 121 | 3.7 |
| උසස්තත්වයේ බීජ සහ පැල ලබාගත නොහැකිවීම | 8 | 5.2 |
| අලෙවිකිරීමේ ගැටළු/ හොඳ මිලක් නොමැතිකම | 40 | 26.3 |
| කෘෂිකාර්මික උපකරණ නොමැති වීම | 3 | 1.9 |
| මූල්‍ය ධනය නොමැතිවීම | 26 | 17.1 |
| මාර්ග අපහසුතා නිසා ඇතිවන ප්‍රවාහන ගැටළු | 18 | 11.8 |
| ඉඩම් හිගය/ කුඹුරු ඉඩම් අයිතිය නොමැති වීම | 15 | 9.8 |
| සත්ත්ව හානි නිසා වගා හානි සිදුවීම | 89 | 58.5 |
| කෘෂිකර්ම යෙදවුම් වල අධික මිල | 8 | 5.3 |
| පසේ සාරවත් භාවය අඩුවීම | 1 | 0.6 |
| කෘෂි කම්කරුවන්ගේ හිගය | 5 | 3.3 |
| නව ගොවිතාක්ෂණයන් ලබා ගැනීමේ අපහසුතා | 1 | 0.6 |

*වගු අංක 18*

## සත්ත්ව පාලනය

ගම - පහලසියඹලැව

| පිළිතුරු | සංඛ්‍යාව | % |
|---|---|---|
| ඔව් | 12 | 41.38 |
| නැත | 7 | 24.14 |
| වාර්තා වී නොමැත | 10 | 34.48 |
| **එකතුව** | **29** | **100.00** |

*වගු අංක 18(a)*

## සත්ත්ව පාලනය

ගම - පොතානේගම

| පිළිතුරු | සංඛ්‍යාව | % |
|---|---|---|
| ඔව් | 28 | 18.42 |
| නැත | 52 | 34.21 |
| වාර්තා වී නොමැත | 72 | 47.37 |
| **එකතුව** | **152** | **100.00** |

වගු අංක **19**

## ඇතිකරන සතුන් වර්ගයන්

ගම - පහලසියඹලෑව

| සතුන් වර්ගය | සංඛ්‍යාව - වැඩුනු | සංඛ්‍යාව - පැටවු |
|---|---|---|
| ගවයන් | 22 | 27 |
| මී හරකුන් | 0 | 4 |
| එළුවන් | 10 | 5 |
| කුකුලන් | 15 | 2 |
| ඌරන් | 2 | 1 |

වගු අංක **19(a)**

## ඇතිකරන සතුන් වර්ගයන්

ගම - පොතානේගම

| සතුන් වර්ගය | සංඛ්‍යාව - වැඩුනු | සංඛ්‍යාව - පැටවු |
|---|---|---|
| ගවයන් | 63 | 27 |
| මී හරකුන් | 34 | 24 |
| එළුවන් | 8 | 4 |
| කුකුලන් | 51 | 8 |
| ඌරන් | 5 | 5 |

වගු අංක **20**

## සත්ත්ව පාලනයේදි මුහුණ දෙන ගැටළු

ගම - පහලසියඹලෑව (සත්ත්ව පාලනයේ යෙදෙන පවුල් සංඛ්‍යාව - 12)

| ප්‍රශ්ණය | සංඛ්‍යාව | % |
|---|---|---|
| සත්ත්ව නිශ්පාදනය සම්බන්ධ සේවා පහසුකම් නොලැබීම | 1 | 8.3 |
| ජල අපහසුතා | 1 | 8.3 |

ආ... LIB... ...පු ආ... HARTI

*වගු අංක 20 (a)*

## සත්ත්වපාලනයේදී මුහුණ දෙන ගැටළු

ගම - පොතානේගම (සත්ත්ව පාලනයේ යෙදෙන පවුල් සංඛ්‍යාව - 28)

| ප්‍රශ්ණය | සංඛ්‍යාව | % |
|---|---|---|
| සත්ත්ව නිෂ්පාදනය සම්බන්ධ සේවා පහසුකම් නොලැබීම | 6 | 20.6 |
| ජල අපහසුතා | 4 | 14.2 |
| සතුන් සඳහා ආහාර ලබාදීමේ අපහසුතා | 6 | 20.6 |
| මුල්‍යමය ගැටළු | 4 | 14.2 |
| සත්ත්ව පාලනය පිළිබඳ හොඳ දැනුමක් නැතිවීම | 1 | 3.6 |
| සතුන් සඳහා මඩු සකස් කර ගැනීමේ අපහසුතා | 3 | 10.8 |
| කම්කරු හිගය | 1 | 3.6 |
| උසස් තත්වයේ සතුන් නැතිවීම | 5 | 17.8 |
| ඉඩ නොමැති කම | 1 | 3.6 |
| අලෙවි ප්‍රශ්න | 2 | 7.2 |

*වගු අංක 21*

## කෘෂිකර්ම කටයුතු සහ සත්ත්ව පාලනය සඳහා සේවය ලබාගැනීම පිළිබඳව ඇති ගැටළු

ගම - පහලසියඹලැව

| ප්‍රශ්නය | සංඛ්‍යාව | % |
|---|---|---|
| නිලධාරින් හමුවීමට නගරයට යාමට සිදුවීම | 10 | 58.8 |
| ප්‍රවාහන දුෂ්කරතා | 7 | 41.2 |
| එකතුව | 17 | 100.0 |

*වගු අංක 21 (ආ)*

## කෘසිකර්ම කටයුතු සහ සත්ත්ව පාලනය සඳහා සේවය ලබාගැනීම පිළිබඳව ඇති ගැටළු

ගම - පොතානේගම

| ප්‍රශ්නය | සංඛ්‍යාව | % |
|---|---|---|
| නිලධාරීන් හමුවීමට නගරයට යාමට සිදුවීම | 45 | 46.4 |
| ප්‍රවාහන දුෂ්කරතා | 43 | 44.3 |
| නිලධාරීන් නිතර කාර්යාලයේ රැඳී නොසිටීම | 8 | 8.2 |
| ගැටළුවක් නැත | 1 | 1.3 |
| එකතුව | 97 | 100.0 |

*වගු අංක 22*

## කෘෂිකර්මය හෝ වෙනත් අවශ්‍යතාවන් සඳහා ණය ලබා ගැනීම

ගම - පොතානේගම

| ණය ප්‍රමාණය | ගත් සංඛ්‍යාව | මුළු මුදල | සාමාන්‍යය |
|---|---|---|---|
| 0 - <= 5000 | 19 | 82000 | 4315.79 |
| 5000> - < = 10000 | 8 | 76200 | 9525.00 |
| 10000 . - < = 25000 | 5 | 99000 | 19800.00 |
| 25000 > - | 1 | 100000 | 10000.00 |
| එකතුව | 33 | 357200 | 10824.24 |

*වගු අංක 23*

## ණය ලබාගත් කාරනා

ගම - පොතානේගම

| හේතුව | ගත් සංඛ්‍යාව | මුළු මුදල | සාමාන්‍යය |
|---|---|---|---|
| වාර්තා නොකළ | 2 | 15000 | 7500.00 |
| ගොවිතැන් සඳහා | 27 | 189200 | 7007.00 |
| ස්වයං රැකියා සඳහා | 2 | 50000 | 25000.00 |
| පුද්ගලික කාරනා සඳහා | 1 | 30000 | 3000.00 |
| ණයක් ගෙවීමට | 1 | 100000 | 100000.00 |

*වගු අංක* ***24***

## ණය ලබාගත් මාර්ගයන්

ගම - පොතානේගම

| | ගණන | මුඹ මුදල | සාමාන්‍ය |
|---|---|---|---|
| වාර්තා නොකල | 6 | 46200 | 77000.00 |
| සමෘද්ධි බැංකුව | 15 | 128000 | 8533.33 |
| ලංකා බැංකුව | 2 | 18000 | 9000.00 |
| මහජන බැංකුව | 1 | 10000 | 10000.00 |
| ග්‍රාමීය බැංකුව | 1 | 23000 | 23000.00 |
| ගොවි බැංකුව | 4 | 15000 | 3750.00 |
| කාන්තා සංගමය | 1 | 2000 | 2000.00 |
| යහළුවකුගෙන් | 2 | 103000 | 51500.00 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 1 | 12000 | 12000.00 |
| එකතුව | 33 | 357200 | 10824.24 |

*වගු අංක* ***25***

## බැංකු ගිණුම් පවත්වාගෙන යාම

ගම - පහලසියඹලෑව

| සේවය | ගණන | % |
|---|---|---|
| ලංකා බැංකුව | 10 | 52.6 |
| මහජන බැංකුව | 4 | 21.0 |
| සමෘද්ධි බැංකුව | 3 | 15.7 |
| ග්‍රාමීය බැංකුව | 2 | 10.5 |
| එකතුව | 19 | 100.0 |

*වගු අංක* ***25 (a)***

## බැංකු ගිණුම් පවත්වාගෙන යාම

ගම - පොතානේගම

| සේවය | ගණන | % |
|---|---|---|
| ලංකා බැංකුව | 21 | 17.36 |
| මහජන බැංකුව | 46 | 38.02 |
| හැටන් නැෂනල් බැංකුව | 1 | 0.83 |
| සමෘද්ධි බැංකුව | 43 | 35.54 |
| ග්‍රාමීය බැංකුව | 3 | 2.48 |
| ගොවි බැංකුව | 3 | 2.48 |
| ඉතිරිකිරීමේ බැංකුව | 2 | 1.65 |
| වාර්තා නොකල | 2 | 1.65 |
| එකතුව | 121 | 100.00 |

*වගු අංක 26*

## කෘෂිකාර්මික අලෙවි මාර්ග

ගම - පහලසියඹලෑව

| නිශ්පාදනය | පුද්ගලික වෙළඳුන් | | සති පොල | | ස්ථිර කෙනෙකු නැත | | මිල දී ගන්නා | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| එළවළු | 6.00 | 27.27 | 1 | 100.00 | 6 | 85.71 | 2 | 40.00 |
| වී | 13.00 | 59.09 | 0 | 0.00 | 1 | 14.29 | 2 | 40.00 |
| කිරි | 1.00 | 4.55 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| බිත්තර | 1.00 | 4.55 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 20.00 |
| සතුන් | 1.00 | 4.55 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| | 22.00 | 100.00 | 1 | 100.00 | 7 | 100.00 | 5 | 100.00 |

*වගු අංක 26 (a)*

## කෘෂිකාර්මික අලෙවි මාර්ග

ගම - පොතානේගම

| නිශ්පාදනය | පුද්ගලික වෙළඳුන් | | සති පොල | | පාරිභෝගිකයන් | | එකතු කරන්නා | | ස්ථිර ගැනුම්කරු | | දුම්කොල සමාගම | | පාරිභොගිකයා | | මිල දී ගන්නා | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | No. | % | No. | % | No. | % | No | % | No. | % | No. | % | No | % | No. | % |
| එළවළු | 10 | 13.70 | 7 | 50.00 | 2 | 50.00 | 3 | 17.65 | 1 | 100.00 | 0 | 0.00 | 4 | 26.67 | 3 | 37.50 |
| වී | 45 | 61.64 | 7 | 50.00 | 1 | 25.00 | 7 | 41.18 | 0 | 0.00 | 0 | 0.00 | 10 | 66.67 | 5 | 62.50 |
| කිරි | 1 | 1.37 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 6.67 | 0 | 0.00 |
| බිත්තර | 2 | 2.74 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| සතුන් | 15 | 20.55 | 0 | 0.00 | 1 | 25.00 | 7 | 41.18 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 |
| දුම්කොල | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 | 0 | 0.00 | 0 | 0.00 |
| එකතුව | 73 | 100.00 | 1 | 100.00 | 4 | 100.00 | 17 | 100.00 | 1 | 100.00 | 1 | 100.00 | 15 | 100.00 | 8 | 100.00 |

*වගු අංක 27*

## අලවියේදී මුහුණ දෙන ගැටළු

ගම - පහලසියඹලැව

| ගැටළු | සංඛ්‍යාව | % |
|---|---|---|
| ප්‍රවාහන අපහසුතාවයන් | 16 | 55.1 |
| බොහෝ දුර රැගෙන සාමට සිදු වීම | 16 | 55.1 |
| අඩු මිලක් ලැබීම | 17 | 58.6 |
| ප්‍රවාහනයේදී සිදුවන හානිය | 7 | 24.1 |
| වාර්තා නොකල | 11 | 37.9 |

*වගු අංක 27(a)*

## අලවියේදී මුහුණ දෙන ගැටළු

ගම - පොතානේගම

| ගැටළු | සංඛ්‍යාව | % |
|---|---|---|
| ප්‍රවාහන අපහසුතාවයන් | 79 | 51.9 |
| මුදල් ලැබීමේ ප්‍රමාදයන් | 11 | 7.2 |
| බොහෝ දුර රැගෙන සාමට සිදු වීම | 58 | 38.1 |
| අඩු මිලක් ලැබීම | 92 | 60.5 |
| ප්‍රවාහනයේදී සිදුවන හානිය | 19 | 12.5 |
| වාර්තා නොකල | 52 | 34.2 |

*වගු අංක 28*

## ගොවි සංවිධානය මගින් ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්

ගම - පහලසියඹලැව

| ක්‍රියාකාරකම් | සංඛ්‍යාව | % |
|---|---|---|
| මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු | 18 | 100.0 |
| ජල කළමණාකරන කටයුතු | 8 | 44.4 |
| කෘෂිකාර්මික දැනුම වැඩිකිරීමේ වැඩසටහන් | 4 | 22.2 |
| ගොවීන් අතර එකමුතු කම ආරක්ෂා කිරීම | 6 | 33.3 |

*වගු අංක 28 (a)*

## ගොවි සංවිධානය මගින් ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්

ගම - පොතානේගම

| ක්‍රියාකාරකම් | සංඛ්‍යාව | % |
|---|---|---|
| මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු | 4 | 3.7 |
| ජල කළමණාකරන කටයුතු | 33 | 30.8 |
| කෘෂිකාර්මික දැනුම වැඩිකිරීමේ වැඩසටහන් | 47 | 43.9 |
| ගොවින් අතර එකමුතු කම ආරක්ෂා කිරීම | 5 | 4.6 |
| පැල බෙදා දීමේ වැඩසටහන් | 35 | 32.7 |
| ඉඩම් අයිතිය පිළිබඳ ගැටළු වලට විසඳුම් ලබා දීම | 14 | 1.3 |
| ශ්‍රම දාන සංවිධානය කිරීම | 56 | 52.3 |
| ගොවින් සඳහා ණය නිකුත් කිරීම | 22 | 20.5 |
| කෘෂිකාර්මික ගැටළු වලට විසඳුම් ලබාදීම | 5 | 4.6 |
| ගමේ පොදු වැඩ වලට සහයෝගය දීම | 3 | 2.8 |
| කන්න රැස්වීම් පැවැත්වීම | 4 | 3.7 |

*වගු අංක 29*

## වෙනත් සංවිධාන වල සහභාගිත්වය

ගම - පහලසියඹලෑව

| සංවිධානය | සාමාජිකයන් | % | නිලධාරීන් |
|---|---|---|---|
| මරණාධාර සමිතිය | 24 | 82.7 | 2 |
| විහාර වර්ධන සමිතිය | 10 | 34.5 | 0 |
| පාසල් සංවර්ධන සමිතිය | 2 | 6.9 | 0 |
| සමෘද්ධි සමිතිය | 0 | 0.0 | 1 |

*වගු අංක 29 (a)*

## වෙනත් සංවිධාන වල සහභාගිත්වය

ගම - පොතානේගම

| සංවිධානය | සාමාජිකයන් | % | නිලධාරීන් |
|---|---|---|---|
| මරණාධාර සමිතිය | 129 | 84.8 | 9 |
| විහාර වර්ධන සමිතිය | 54 | 35.5 | 1 |
| පාසල් සංවර්ධන සමිතිය | 2 | 1.3 | 0 |
| සමෘද්ධි සමිතිය | 31 | 20.4 | 5 |
| එක්සත් සමිතිය | 0 | 0 | 2 |
| කාන්තා සංගමය | 3 | 1.9 | 0 |
| කණ්ඩායම් එකමුතුව | 1 | 0.6 | 0 |
| තරුණ බලකාය | 1 | 0.6 | 0 |

*වගු අංක 30*

## ගමේ සංවර්ධනයට ඇති බාධක

ගම - පහලසියඹලෑව

| බාධක | සංඛ්‍යාව | % |
|---|---|---|
| ජල හිඟය | 11 | 37.9 |
| ප්‍රවාහන අපහසුතා | 12 | 41.4 |
| ආසන්න නගර වලට ඒමට මාර්ග අපහසුතා | 15 | 57.7 |
| සම්පත් හිගය | 11 | 37.9 |
| දේශපාලන ඇගිලි ගැසීම් | 2 | 6.9 |

*වගු අංක 30 (a)*

## ගමේ සංවර්ධනයට ඇති බාධක

ගම - පොතානේගම

| බාධක | සංඛ්‍යාව | % |
|---|---|---|
| ජල හිඟය | 140 | 92.1 |
| ප්‍රවාහන අපහසුතා | 112 | 73.7 |
| මාර්ග අපහසුතා | 110 | 72.3 |
| රාජ්‍ය නිලධාරින්ගෙන් සහායක් නොලැබීම | 48 | 31.5 |
| ගමේ එකමුතුවක් නොමැති කම | 73 | 48.0 |
| සම්පත් හිගය | 31 | 20.4 |
| දේශපාලන ඇගිලි ගැසීම් | 74 | 48.7 |
| බීමට ජල පහසුකම් නොමැති කම | 14 | 9.2 |
| විදුලි බලය නොමැති වීම | 12 | 7.9 |
| වල් අලින්ගෙන් වන හානි | 34 | 22.4 |
| සම්ප්‍රදායක මතිමතාන්තර | 1 | 0.6 |
| හොඳ නායකත්වයක් නොමැති වීම | 1 | 0.6 |
| සෞඛ්‍ය පහසුකම් නොමැති වීම | 1 | 0.6 |

වගු අංක 31

## ගම සංවර්ධනය කිරීම සඳහා යෝජනා

ගම - පහලසියඹලෑව (නිවාස සංඛ්‍යාව 29)

| කාර්යයන් | සංඛ්‍යාව | % |
|---|---|---|
| වැව් ප්‍රතිසංස්කරණය | 18 | 62.0 |
| සියඹලංගමුව ඔය හරහා පාලමක් ඉදිකර දීම | 28 | 96.5 |
| බීමට හා කෘෂි කර්මාන්තයට ජල පහසුව ලබා දීම | 28 | 96.5 |
| විදුලි බලය ලබා දීම | 10 | 34.5 |
| තැපැල් පහසුකම් ලබා දීම | 1 | 3.5 |

වගු අංක 31 (a)

## ගම සංවර්ධනය කිරීම සඳහා යෝජනා

ගම - පහලසියඹලෑව

| කාර්යයන් | සංඛ්‍යාව | % |
|---|---|---|
| වැව් ප්‍රතිසංස්කරණය | 37 | 24.3 |
| මාර්ග ප්‍රතිසංස්කරණය | 79 | 51.9 |
| බීමට හා කෘෂි කර්මාන්තයට ජල පහසුව ලබා දීම | 99 | 65.1 |
| විදුලි බලය ලබා දීම | 70 | 46.0 |
| රාජ්‍ය නිලධාරීන්ගේ සහාය ලබාදීම | 8 | 5.3 |
| ප්‍රවාහන පහසුකම් ගමට ලබා දීම | 18 | 11.8 |
| වල් අලි උවදුරට විසඳුම් ලබා දීම | 19 | 12.5 |
| වගා කිරීම සඳහා ඉඩම් ලබාදීම | 2 | 1.3 |
| ගමේ සමගිය ඇති කිරීම | 5 | 3.3 |
| කෘෂිකාර්මික දැනුම වර්ධනය කිරීම | 5 | 3.3 |
| සෞඛ්‍ය පහසුකම් සලසා දීම | 8 | 5.3 |
| අලෙවි පහසුකම් ලබා දීම | 2 | 1.3 |
| අධ්‍යාපන පහසුකම් ලබා දීම | 2 | 1.3 |
| උසස් බීජ / පැල වර්ග ගොවීන්ට ලබා දීම | 1 | 0.6 |
| වැසිකිලි පහසුකම් ලබාදීම | 1 | 0.6 |

පුස්තකාලය
LIBRARY
...ප.පු ආ
MARTI
21456